# ශ්‍රී ලංකාවේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳ විමසුමක්: දඹුල්ල කැප්පෙටිපොළ සහ මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ප්‍රගතිය පිළිබඳව කෙරෙන තුළනාත්මක විග්‍රහයකි.

ඩබ්.එච්. දුමින්ද ප්‍රියදර්ශන – පර්යේෂණ නිලධාරී

## සංක්ෂේපය

දේශීය කෘෂි නිෂ්පාදනය සඳහා නිසි වෙළෙඳපොළක් සැකසීමේ ජාතික අරමුණ මත ශ්‍රී ලංකාවේ විවිධ නිෂ්පාදන සහ අලෙවි ප්‍රදේශයන් මූලික කොටගෙන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීම 2000 දශකයේ අග භාගයේදී පමණ රාජ්‍ය අනුග්‍රහය මත සිදුවිය. දිනෙන් දින වැඩිවන ජනගහනය සමග ජනතාවගේ මූලික අවශ්‍යතා ඉහළ යාම හරහා අලෙවිකරණයට නිසි තැනක් ලබාදීම අවශ්‍ය කරුණක් විය. විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මෙරටට හඳුන්වාදීමත් සමගම අලෙවිකරණ කටයුතුවලින් රජය ක්‍රමයෙන් ඉවත් වීම සිදු විය. පසුගිය වසර කිහිපය තුළ නැවතත් කෘෂි නිෂ්පාදන සඳහා නිසි වෙළෙඳපොළක් සැකසීමේ අවශ්‍යතාවය පැන නැගිණි. මන්ද නිෂ්පාදන සහ පාරිභෝගික දෙඅංශය අතර පවත්නා ඉතා දැඩි දුරස්ථ තත්ත්වය තුළ නිෂ්පාදකයා වෙත ඉතා පහළ මිලක් ලැබීමත් පාරිභෝගිකයාට ඉතා ඉහළ මිලකට නිෂ්පාදන ගැනීමට සිදුවීමත් දැකිය හැකි විය. මේ තත්ත්වය තුළ නිෂ්පාදකයා හා තොග වෙළෙන්දා අතර පවතින දුරස්ථභාවය අඩුකර, අතරමැදිකරණයකින් තොරව කටයුතු කළ හැකි තත්ත්වයක් මෙම ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමේදී අපේක්ෂා කළ මූලික කරුණ විය. මෙම ආකාරයට ආර්ථික මධ්‍යස්ථාන ආරම්භය තුළ සුවිශේෂ වූ ජාතික අරමුණක සිට නිෂ්පාදන සහ පාරිභෝගික දෙපාර්ශවයගේ අරමුණු සඵල කර ගැනීම අපේක්ෂා කළ ද ඒවා ඉටුවීද? යන්න අධ්‍යයනය කළ යුතු වේ. පවතින අර්ථික මධ්‍යස්ථාන ආරම්භක තත්ත්වයේ සිට මෙතෙක් කිසිදු ඇගයීමකට ලක් නොවීමෙන් සහ පවතින දුර්වලතා, ගැටලු හඳුනාගැනීමකින් තොරව තව තවත් ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීම එතරම් යෝග්‍ය නොවේ. මෙවැනි පසුබිමක් තුළ සිට ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානවල පවතින තත්ත්වය මත ගනුදෙනු සිදුවන ආකාරය හඳුනා ගැනීම මෙන්ම ගැටලු සහ අපේක්ෂිත තත්ත්වයන් අසාර්ථක වී ඇත්නම් ඒ සඳහා හේතු පෙන්වා දීමත් ඉදිරියේදී ආරම්භ කිරීමට නියමිත ආර්ථික මධ්‍යස්ථාන තුළ කුමන වෙනස්කම් සිදු විය යුතු ද සහ ඒ සඳහා අවශ්‍ය නිර්දේශ ලබාදීම මෙම ලිපියෙහි මූලික අරමුණ වේ.

## හැඳින්වීම

කෘෂිකාර්මික වෙළඳපොළ පිළිබඳව බොහොමයක් අධ්‍යයන වාර්තා මගින් පෙන්වා දී ඇති මූලික කරුණක් වන්නේ ප්‍රමාණවත් තරම් පාදක ව්‍යුහයක් නොමැතිවීමයි. ශ්‍රී ලංකාවේ ප්‍රමාණවත් තරම් පාදකමය ව්‍යුහය පහසුකම් නොමැතිවීම නිසා මෙම ක්ෂේත්‍රය තුළ ගැටලු රාශියක් දක්නට විය. මෙම තත්ත්වය සමනය කිරීම සඳහා පසුගිය දශක දෙක තුළ වෙළෙඳපොළ පාදක ව්‍යුහමය සංවර්ධනය වරින්වර පත්වන රජයන්හි ප්‍රධාන අරමුණ විය. මේ සඳහා ස්වාභාවික හේතූන් මත පිහිටි දඹුල්ල වැනි මධ්‍යස්ථාන පාදක කොට ගෙන විධිමත් ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ විය. මේ තුළින් මනා අත්දැකීමක් රාජ්‍ය ප්‍රතිපත්තියට එක් කළ අතර මෙය පදනම් කර ගත් රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදකයින් දිවයින පුරා ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවීමේ විධිමත් වැඩපිළිවෙලක් ආරම්භ කළේය. මෙම වැඩ පිළිවෙල සාර්ථක කර ගැනීමේදී දැනට ක්‍රියාත්මක විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන පිළිබඳ ඇගයීමක් සිදු කිරීම කාලීන වශයෙන් වැදගත් විය. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුළින් දඹුල්ල, කැප්පෙටිපොල සහ මීගොඩ යන ප්‍රධාන මධ්‍යස්ථාන පර්යේෂණ ඒකකයක් ලෙස ගෙන මෙම අධ්‍යයනය සිදු කරනු ලැබිය. ඒ මගින් මෙම ආර්ථික මධ්‍යස්ථාන තුන තුළ ක්‍රියාත්මක ස්වරූපය මත ඒ හා දායක වන විවිධ වූ පාර්ශවයන්ට පවතින ගැටලු සහ අඩුපාඩුකම් අධ්‍යයනයට ලක් විය.

## අධ්‍යයන පසුබිම

කෘෂිකාර්මික ක්ෂේත්‍රය ශ්‍රී ලංකා ආර්ථිකයේ මිනුම් ඒකක අතර වැදගත් ස්ථානයක් ගන්නා බව සනාථ වී ඇත. මේ අතර කෘෂිකර්මාන්තය තම ජීවනෝපාය කරගත් විශාල පිරිසක් සිටින අතරම ඔවුන්ගෙන් යැපෙන කණ්ඩායම් ද ඉතා විශාලය (57%). කෙසේ වුවත්, කෘෂි භෝග නිෂ්පාදනය වැඩි කිරීමට වැඩි අවධානයක් යොමු වී ඇති අතර එම නිෂ්පාදන සඳහා වඩා සාධාරණ මිලක් ලබා ගැනීම නිෂ්පාදකයින් මුහුණ දුන් ප්‍රධාන ගැටලුවක් විය. එසේම පාරිභෝගිකයන් ගේ අංශයෙන් සළකා බලන විට හැකිතාක් අඩු මිලකට ගුණාත්මයෙන් උසස් කෘෂි නිෂ්පාදන මිල දී ගැනීමට පාරිභෝගිකයන් කැමැත්තක් හා උනන්දුවක් දක්වන නමුත් එයට අවස්ථාවක් වෙළෙඳපොළ තුළ දක්නට නොමැති විය. මෙයට සාධාරණයක් ඉටු කිරීම සඳහා 1970 දශකයේ අලෙවි සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. විවිධාකාර හේතු මත, එම ප්‍රයත්නය ද අසාර්ථක විය. විවෘත ආර්ථික ප්‍රතිපත්ති හඳුන්වා දීමත් සමගම නිෂ්පාදකයාට තමන් කැමති වෙළෙන්දෙකුට තම නිෂ්පාදන අලෙවි කිරීමේ හැකියාව උදාවිය. එසේම පාරිභෝගිකයන්ට ද, තමන්ගේ රුචිය අනුව නිෂ්පාදන මිලට ගැනීමේ හැකියාව උදාවිය. කෙසේ වෙතත්, මෙහිදී ද විවෘත ආර්ථික ප්‍රතිපත්ති තුළින් බලාපොරොත්තු වූ දෙය ඉටු නොවුනි. තවදුරටත් පෙර දී මෙන්ම වැදගත් වූ කරුණක් වූයේ වෙළෙඳපොළේ දී ගොවියාට/නිෂ්පාදකයාට අඩු මිලක් ලැබීමත්, පාරිභෝගිකයා ඉතා ඉහළ මිලක් ගෙවීමත් ය. මෙහිදී එම නිෂ්පාදනයන් පාරිභෝගිකයා වෙත ලගාවන තුරු යොදවන සේවාවන් පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වන අතර වෙළෙඳපොළ තරඟකාරිත්වය තුළින් ඉල්ලුම හා සැපයුම මත මිල තීරණය වීමට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය කරුණක් විය.

ගොවියාට තම නිෂ්පාදන සඳහා ලැබෙන මිල හා පාරිභෝගිකයා එම නිෂ්පාදන සඳහා ගෙවන මිල අතර පරාසය සැළකිල්ලට ගනිමින්, එම තත්ත්වය අවම කිරීම සඳහා විවිධ උපක්‍රම වරින් වර පත්වූ රජයන් විසින් ගන්නා ලදී. 20 වන සියවසේ අගභාගය වන විට, මෙරට ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවන ලදී. බොහෝ දෙනෙකුගේ විශ්වාසය වූයේ මිල ඉහළ යාමට ප්‍රධාන හේතුව අතරමැදි වෙළඳුන් අධික ලාභ ලබන්නේය යන්නයි. නිෂ්පාදකයා අතරමැදි ග්‍රහණයෙන් ගලවා ගැනීමට ද, ගොවියාට/නිෂ්පාදකයාට තම නිෂ්පාදන කෙළින්ම තොග වෙළඳුනට අලෙවි කිරීමට අවස්ථාව ලබාදීම ද යටිතල පහසුකම් සැළසීම අවශ්‍ය වූ බැවින් ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවන ලදී. කෘෂි නිෂ්පාදන අලෙවියේදී නිෂ්පාදකයා මුහුණදෙන ගැටලුවට මෙය ඵලදායී විසඳුමක් වනු ඇතැයි ආර්ථික විද්වතුන්ගේ විශ්වාසය පල කෙරිණි. එබැවින්, රාජ්‍ය අනුග්‍රහය ලබාදෙමින් විශාල ආයෝජනයක් කරමින් නිෂ්පාදන ප්‍රදේශයන්හි (දඹුල්ල හා කැප්පෙටිපොළ) මෙන්ම පාරිභෝගික ප්‍රදේශයක ද (මීගොඩ) ආර්ථික මධ්‍යස්ථාන පිහිටුවන ලදී. එම මධ්‍යස්ථාන තුළින් අපේක්ෂිත අරමුණු ඉටු වූවාද යන්න අධ්‍යයනය කළ යුතු වූ කරුණක් විය.

## ආර්ථික මධ්‍යස්ථාන බිහි කිරීමේ වැඩ පිළිවෙලෙහි ප්‍රධාන අරමුණු

1. නිෂ්පාදකයා සහ තොග වෙළෙන්දා අතරමැදිකරණයකින් තොරව (අතරමැදිකරණය අවම වීමක් හෝ) හමුවීම තුළින් වෙළෙඳපොළ කටයුතු කරගෙන යාමට සැළැස්වීම.
2. දේශීය කෘෂි නිෂ්පාදනය සඳහා නිසි වෙළෙඳපොළක් සැකසීම.

ඉහත දැක්වූ ප්‍රධාන අරමුණුවලට අමතරව ඒ ඒ ආර්ථික මධ්‍යස්ථාන සඳහා අදාළ වූ සුවිශේෂී අරමුණු ද පවතී.

## අධ්‍යයනය හා අරමුණු

ආර්ථික මධ්‍යස්ථාන බිහිකිරීමේ වැඩසටහන ආරම්භ කර සැලකිය යුතු කාලයක් ගත වී හමාරය. මේ වනවිට ආර්ථික මධ්‍යස්ථාන ගණනාවක් බිහිකර ඇති අතර තවත් ගණනාවක් බිහි කිරීම සඳහා කටයුතු කරගෙන යනු දක්නට ලැබේ. මේ අයුරින් මෙම වැඩසටහන ප්‍රධාන සංවර්ධන ක්‍රමෝපාය ක් බවට පත් වුවද එය ක්‍රමවත් ඇගයුමකට භාජනය වී නොමැත. මෙම අධ්‍යයනය ඒ සඳහා දැරූ උත්සාහයකි. අධ්‍යයනයෙහි මූලික අරමුණු වන්නේ,

1. ආර්ථික මධ්‍යස්ථාන බිහි කිරීමෙන් අපේක්ෂිත අරමුණු කෙතරම් දුරට ඉටු වී ඇත්දැයි විමසා බැලීම පවතින ආර්ථික මධ්‍යස්ථානයන්හි ක්‍රියාකාරිත්වය හඳුනා ගැනීම.
   - නිෂ්පාදන සැපයුම් ප්‍රදේශ
   - නිෂ්පාදන ඉල්ලුම් ප්‍රදේශ
   - නිෂ්පාදන සැපයුම්/ඉල්ලුම් වේලාව අනුව සිදු වීම
   - මිල වෙනස් වීම

2. ආර්ථික මධ්‍යස්ථාන වල පවතින ගැටලු සහ අඩපාඩු හඳුනා ගැනීම. ඒ තුළ ආර්ථික මධ්‍යස්ථානයන්ට සම්බන්ධ නිෂ්පාදකයන්ට, වෙළඳසැල් හිමියන්ට සහ නිෂ්පාදන රැගෙන යන්නන්ට යන පාර්ශවයන්ට පවතින ගැටලු හඳුනා ගැනීම.

3. නව මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේදී ක්‍රියාත්මක කළයුතු ප්‍රතිපත්තිමය නිර්දේශ හඳුනා ගැනීම.

## අධ්‍යයන ක්‍රමවේදය

තෝරාගත් ආර්ථික මධ්‍යස්ථාන තුනක් එනම් දඹුල්ල, කැප්පෙටිපොළ, මීගොඩ ඇසුරින් සිදු කරනු ලැබූ සමීක්ෂණයක් ඇසුරින් මෙම අධ්‍යයනය සිදු කරනු ලැබිණ. අධ්‍යයන සඳහා ආර්ථික මධ්‍යස්ථාන තෝරා ගැනීම්දී නිෂ්පාදන ප්‍රදේශ සහ අලෙවි ප්‍රදේශ නියෝජනය වන පරිදි තෝරා ගැනීමට අමතරව ඒවා පිහිටුවීමේ අරමුණු විවිධ වීම කෙරෙහි ද අවධානය යොමු කෙරිණි. ඉහත සඳහන් කළ ප්‍රධාන අරමුණුවලට අමතරව කැප්පෙටිපොළ සහ මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයන්හි සෙසු අරමුණු ද ඇති අතර ඒවා ඒ ඒ මධ්‍යස්ථාන පිළිබඳව ඉදිරිපත් කළ කරුණු දැක්වීම් යටතේ පෙන්වා ඇත.

අඛණ්ඩ දින 07 ක කාලයක් ආර්ථික මධ්‍යස්ථාන වෙත නිෂ්පාදන පැමිණීම සහ පිටවීම ගණනය කිරීම සිදුකර ඇත. ඒ තුළ ඉල්ලුම් / සැපයුම් ප්‍රදේශ හඳුනා ගැනීම, විවිධ වේලාවන්හි දී පැමිණෙන සහ පිටවෙන වාහන ප්‍රමාණයන්, නිෂ්පාදන ප්‍රමාණයන්, ගණනය කිරීම යනාදිය සිදු කෙරිණි. නිෂ්පාදකයින්, නිෂ්පාදන රැගෙන යන්නන්, වෙළෙඳසැල් හිමියන්, අතරමැදියන් යන කණ්ඩායම්වලින් 50 දෙනා බැගින් සසම්භාවීව තෝරාගෙන අවශ්‍ය දත්ත සහ තොරතුරු ලබා ගැනීම සිදු විය. මෙයට අමතරව වෙළෙඳ සංගමය, නාට්ටාම් සංගමය, ගොවි සංවිධාන වලින් සහ අදාළ පාලන අධිකාරියෙන් තොරතුරු ලබාගැනීම ද සිදු කෙරිණි. අවසානයේ ලබාගත් දත්ත සහ තොරතුරු ආර්ථික-සමාජ විද්‍යාත්මක ක්‍රමවේදයන් ඔස්සේ විශ්ලේෂණය කරනු ලැබීය.

## දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය

ශ්‍රී ලංකාවේ මධ්‍යම කඳුකරයට උතුරු දෙසින් මායිම්ව මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල ප්‍රදේශයේ පැවති පැරණි එළවළු තොග වෙළෙඳපොළ පදනම් කොට ගෙන එය වඩාත් සංවර්ධනය කරලීමේ අභිලාශයෙන් මෙම මධ්‍යස්ථානය 1999 මාර්තු මස රු. මිලියන 115 ක් වූ ආයෝජනයෙහි ප්‍රතිඵලයක්

ලෙස ආරම්භ විය. ප්‍රදේශයේ පිහිටීම අතින් ඉතා සාර්ථක ස්ථානයක ආරම්භ කර තිබීම මත විවිධ අඩුපාඩු පැවතිය ද, සමස්ථයක් ලෙස සාර්ථක ආර්ථික මධ්‍යස්ථානයක් ලෙස දැක්විය හැකිය. එනම් ප්‍රදේශයේ පිහිටීමෙහි යෝග්‍යතාව ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමට ප්‍රථම විමසා බැලීමට හොඳම උදාහරණය මෙම මධ්‍යස්ථානය වේ. ආරම්භයේදී කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය යටතේ ආරම්භ වූ මෙය වර්තමානය වන විට ග්‍රාමීය කටයුතු පිළිබඳ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙම මධ්‍යස්ථානය ද ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණු වූයේ නිෂ්පාදකයාට සහ වෙළෙන්දාට අතරමැදිකරණයකින් තොරව ගනුදෙනු කළ හැකි තත්ත්වයක් ඇතිකිරීම සහ දේශීය කෘෂි නිෂ්පාදනවලට නිසි වෙළෙඳපොළක් සැකසීමයි.

වෙළෙඳසැල් 144කින් සමන්විත දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ විශාලතම දෙවන එළවළු තොග වෙළෙඳපොළ ලෙස දැක්විය හැකිය. දඹුල්ල නගරයේ පැවති එළවළු වෙළෙඳසැල් 70 ක පමණ ප්‍රමාණය මෙසේ විධිමත් වෙළෙඳපොළක් කරා ගමන් කිරීමට බලපා ඇති ප්‍රධාන සාධක කිහිපයකි.

1. භූගෝලීය වශයෙන් හොඳ පිහිටීමක් පැවතීම. එනම් උතුරු දෙසට අනුරාධපුර හා යාපනයත්, නැගෙනහිර දෙසට ත්‍රිකුණාමලය හා මඩකලපුවත්, දකුණු දෙසට මාතලේ හා මහනුවරත්, බටහිර දෙසට කුරුණෑගල හා කොළඹත් සම්බන්ධ කරන ප්‍රධාන මංසන්ධියක පිහිටා තිබීම. එනිසා, ඒ සෑම දෙසින්ම පැමිණෙන ස්ථානයක පිහිටා තිබීම වැදගත් කරුණකි.

2. වසරේ සෑම කාල වකවානුවකදීම හොඳ තත්ත්වයේ උඩරට/ පහතරට එළවළු සහ ලොකු ළූණු (එළදා කාලයේදී) ලබා ගතහැකි වීම මෙන්ම මාතලේ දිස්ත්‍රික්කය ඉතා හොඳ නිෂ්පාදන ප්‍රදේශයක් වීම (ශ්‍රී ලංකාවේ ලොකු ළූණු වගා කරන ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශය වීම).

3. උතුරු-නැගෙනහිර ප්‍රදේශයන්ගේ පැවති තත්ත්වය මත කිලිනොච්චිය සහ වව්නියාව වැනි ප්‍රදේශවල පැවති ප්‍රධාන තොග වෙළෙඳපොලවල් කඩා වැටීම සහ එම ප්‍රදේශවල වෙළඳුන් මෙන්ම විශාල වශයෙන් ස්ථානගත කර ඇති හමුදා බැරැක්කවලට අවශ්‍ය නිෂ්පාදන මිල දී ගැනීම සඳහා මෙම ස්ථානයට පැමිණීම.

4. වෙළෙඳපොළ රාත්‍රී කාලයේදී විවෘතව පැවතීම නිසා නිෂ්පාදකයන්ට උදේ කාලය තුළ තම ගොවිපළේ කටයුතු කිරීමෙන් පසු අස්වනු නෙලා සවස් කාලය තුළ වෙළෙඳපොළට සැපයිය හැකිවීම. එනම් ඒ තුළ නැවුම් එළවළු සැපයිය හැකි පහසුව.

5. බැංකු මෙන්ම වෙනත් සේවා සැපයුම් ආයතන රාත්‍රී කාලයේත් විවෘතව පැවතීම.

මෙම ආර්ථික මධ්‍යස්ථානයෙහි ක්‍රියාකාරිත්වය, වෙළෙඳපොළ ගනුදෙනු කරුවන්ගේ පැමිණීම කොපමණ සිදුවන්නේ ද යන්නත් වැඩිපුරම පැමිණෙන්නේ කුමන දිස්ත්‍රික්කයෙන් ද යන්නත්, පහත සටහනින් පෙන්නුම් කෙරේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට දෛනිකව සියළුම වර්ගයේ නිෂ්පාදන සහිතව පැමිණෙන වාහන සංඛ්‍යාවේ සාමාන්‍යය 480 කි. සෙනසුරාදා, ඉරිදා මෙන්ම බදාදා දිනවල වැඩිපුර වාහන ප්‍රමාණයක් පැමිණේ. නිෂ්පාදන සහිත වාහන පැමිණීම තුළ මාතලේ දිස්ත්‍රික්කය ඉදිරියෙන්ම සිටිනු දැකිය හැකිය. මෙම ප්‍රදේශයේ දායකත්වය 42% ක් පමණ වේ. දෙවන සහ තෙවන ප්‍රදේශ ලෙස අනුරාධපුර (17%) සහ නුවරඑළිය (13%) දිස්ත්‍රික්ක දැක ගත හැකිය (වගු අංක 01).

මාතලේ දිස්ත්‍රික්කය තුළින් ආර්ථික මධ්‍යස්ථානය වෙත එළවළු ගෙන එන්නන්ගෙන් 90% ක්ම අතමැදියන් නොව ගොවීන්ම වීම විශේෂ ලක්ෂණයකි. ප්‍රදේශයෙන් බැහැරවූ නුවරඑළිය, නුවර, වැලිමඩ,හගුරන්කෙත, වැනි ප්‍රදේශවලින් පැමිණෙන නිෂ්පාදන 95%ක්ම අතරමැදියන් විසින් (එකතුකරන්නන්) වෙළෙඳපොලට සැපයීම් කරයි.

වගු අංක 01: දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය වෙත නිෂ්පාදන පැමිණීමේ හා පිටවීමේ දෛනික ගණන් ගැනීම් (2004.05.15 සිට 2004.05.21 දක්වා)

| දිස්ත්‍රික්කය | පැමිණීම කි.ග්‍රෑ | % | පිටවීම කි.ග්‍රෑ. | % |
|---|---|---|---|---|
| පොළොන්නරුව | 177,150 | 3.1 | 419,665 | 7 |
| අනුරාධපුරය | 952,190 | 16.9 | 84,200 | 14.1 |
| යාපනය | 15,000 | 0.3 | 35,500 | 0.6 |
| මුලතිව් | | 0.00 | 1,500 | 0.0 |
| කිලිනොච්චි | 7,000 | 0.1 | 7,000 | .1 |
| මන්නාරම | 300 | 0.1 | 11,000 | .1 |
| වව්නියාව | 41,450 | 0.7 | 154,300 | 2.6 |
| ත්‍රිකුණාමලය | 71,070 | 1.3 | 411,700 | 6.9 |
| මඩකලපුව | 12,900 | 0.2 | 119,200 | 2.0 |
| පුත්තලම | 136,900 | 2.4 | 150,100 | 2.5 |
| කුරුණෑගල | 197,900 | 3.5 | 749,100 | 12.5 |
| මාතලේ | 1,491,308 | 26.4 | 811,233 | 13.6 |
| කෑගල්ල | 45,200 | .8 | 290,000 | 4.9 |
| කොළඹ | 127,000 | 2.2 | 241,900 | 4.0 |
| කළුතර | 38,000 | .7 | 76,700 | 1.3 |
| රත්නපුර | 48,600 | 0.9 | 48,500 | 0.8 |
| අම්පාර | 51,600 | 0.9 | 75,700 | 1.3 |
| මොණරාගල | 214,150 | 3.8 | 46,100 | 0.8 |
| හම්බන්තොට | 90,500 | 1.6 | 35,000 | 0.6 |
| ගම්පහ | 62,300 | 1.1 | 386,100 | 6.5 |
| ගාල්ල | 39,500 | 0.7 | 89,900 | 1.5 |
| මාතර | 7,500 | 0.1 | 30,150 | 0.5 |
| බදුල්ල | 199,100 | 3.5 | 68,100 | 1.1 |
| නුවර | 331,660 | 5.9 | 652,130 | 10.9 |
| නුවරඑළිය | 1,285,650 | 22.8 | 206,780 | 3.5 |
| එකතුව | 5,643,928 | 100.00 | 5,959,358 | 100.00 |

*මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ - හෙ.ගො.ප.පු. ආයතනය (2004)*

සමස්ථයක් වශයෙන් මෙම ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳපොළ හැසිරීම කුමන ආකාරයෙන් ද යන්න ඉහත වගු සටහන් තුළින් පැහැදිලි වේ.

වගු අංක 01 හි සඳහන් දත්ත නිෂ්පාදන සහිත පැමිණෙන සහ පිටවෙන වාහන පමණක් සැලකීමෙන් ලබා ගෙන ඇත. නිෂ්පාදන රැගෙන එන වාහන සහ පිටවන වාහනවල ධාරිතාව විවිධ ප්‍රමාණයන්ගෙන්

යුක්ත වේ. (කිලෝ ප්‍රමාණය වෙනස් වේ). එමනිසා, පැමිණි වාහන ප්‍රමාණයට වඩා අඩු/වැඩි ප්‍රමාණයක් පිටවීම සිදුවිය හැකිය. ආර්ථික මධ්‍යස්ථානය තුළ නිරන්තරයෙන් කුළී ලොරි රථ ප්‍රමාණයක් පවතින බැවින්, මෙම ප්‍රමාණයන්ගෙන් පිටවීම සඳහා යොදාගැනීම සිදු වේ. මෙම තත්ත්වය කැප්පෙටිපොළ සහ මීගොඩ මධ්‍යස්ථානයන් සඳහා ද අදාළ වේ.


ඉහත සටහන (වගු අංක 1) තුළින් පෙන්නුම් කෙරෙන අන්දමට නිෂ්පාදන ප්‍රදේශයක පිහිටි මෙම මධ්‍යස්ථානය වෙත මාතලේ දිස්ත්‍රික්කයෙන් විශාල වාහන ප්‍රමාණයක් පැමිණීම සහ පිටවීම දැක ගත හැකිය. විශේෂයෙන්ම, දඹුල්ල ප්‍රදේශය අවට විශාල සිල්ලර වෙළෙඳසැල් ප්‍රමාණයක් ඇති අතර මෙම වෙළෙඳසැල් වෙත නිෂ්පාදන සැපයීම ආර්ථික මධ්‍යස්ථානය හරහා සිදු වේ.

## දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ නිෂ්පාදකයින්ගේ අපේක්ෂිත ප්‍රතිලාභ සහ අරමුණු ඉටුවීම

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීමේ පළමු අරමුණ වන දේශීය කෘෂි නිෂ්පාදන සඳහා නිසි වෙළෙඳපොළක් සැකසීම පිළිබඳව සැළකුවිට ආර්ථික මධ්‍යස්ථානය තුළ එය ඉටුකර ගැනීමට ඔබින තෝතැන්නක් නිර්මාණය වී ඇතැයි කිව හැකිය. එය කෘෂි නිෂ්පාදන සැපයුම් සහ ඉල්ලුම් පාර්ශවයන්ට හොඳ තත්ත්වයකි. එනම්, තමන් හුදෙකලා වූ තත්ත්වයක නොසිට විශාල සැපයුම්කරුවන් පිරිසක් සහ ඉල්ලුම්කරුවන් පිරිසක් හමුවීම මත ඔවුනොවුන්ට කේවල් කිරීම හරහා විවිධ පුද්ගල පාර්ශවයන් සමග ගනු දෙනු කළහැකි වීමේ පරිසරයක් ඇති වීමයි.

දෙවන අරමුණ තුළින් අපේක්ෂිත තත්ත්වය වූයේ නිෂ්පාදකයාගේ සිට පාරිභෝගිකයා වෙත නිෂ්පාදන ගලායාමේ දී සම්බන්ධ වන අතරමැදියන් අවම කිරීම වේ. එනම්, අතරමැදිකරණය හරහා සිදුවන නිෂ්පාදන මිල ඉහළ යාම අවම මට්ටමකට ළඟා කිරීම මේ තුළින් අපේක්ෂිතය. උදාහරණ ලෙස බෝංචි කිලෝවක් සඳහා නිෂ්පාදකයා වෙත රු.20ක් ලැබෙන විට එය පාරිභෝගිකයා රු.80 කට මිල දී ගනු ලබන්නේ නම් මෙම අතරමැදිව පවතින රු.60ක ප්‍රමාණය අවම කිරීම මේ තුළින් අපේක්ෂිතය.

ප්‍රධාන අරමුණු වෙතින් ගත්කළ මධ්‍යස්ථාන ආරම්භ කිරීම සෑම පාර්ශවයකටම වැදගත් සේ සැලකිය හැකිය.




මෙම අවස්ථාවේදී නිෂ්පාදකයා කිසියම් නිෂ්පාදනයක් රු.15කට පළමු අතරමැදියා වෙත ලබාදෙන්නේ නම් එය පොළ/තොග වෙළෙන්දා වෙත රු.20 මිලට අලෙවි වීම සිදුවිය හැකිය. මෙහි දී නිෂ්පාදකයා එම නිෂ්පාදනය සෘජුවම ආර්ථික මධ්‍යස්ථාන හරහා පොළ/තොග වෙළෙන්දාට එම මිලටම අලෙවි

කරන්නේ නම්, ඔහුට ලැබෙන මිල රු.19ක් වේ. එනම් (රුපියල් 20 කට වෙළෙඳපොළ තුළ අලෙවිවන විට). ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙඳසැල් හිමියා ලබන කොමිස් මුදල ඉතිරි රුපියල වේ.

මේ ආකාරයට සිදුවන ගනුදෙනුව තුළ නිෂ්පාදකයන්ට ප්‍රවාහන පිරිවැයක් සහ කාල පිරිවැයක් පවතී. මෙහි දී, නිෂ්පාදන ප්‍රදේශයක පිහිටා ඇති ආර්ථික මධ්‍යස්ථාන තුළ නිෂ්පාදකයින් රාශියක් එකතුව ප්‍රවාහන මාධ්‍ය ලබාගෙන තම නිෂ්පාදන අලෙවි කිරීම තුළ ප්‍රවාහන පිරිවැය අවම කරගැනීමෙන් තම නිෂ්පාදන සඳහා උපරිම මිලක් ලබා ගැනීමටත් හැකි වී ඇත. උදා: දඹුල්ල මධ්‍යස්ථානය වෙත මාතලේ දිස්ත්‍රික්කය තුළ සිට ගෙන එන නිෂ්පාදන ප්‍රමාණයෙන් 90% ක් මෙසේ සිදු වේ.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ මෙම පළමු අරමුණ වන නිෂ්පාදකයා සහ තොග වෙළෙන්දා අතර හමුවීමේ තත්ත්වය උපරිම මට්ටමකින් සිදුවන බව පැහැදිලි වේ. එනම් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සැපයෙන නිෂ්පාදන තුළින් 42%ක් සැපයෙන්නේ මාතලේ දිස්ත්‍රික්කයෙන් වීමත් (පිහිටා ඇති දිස්ත්‍රික්කයේ දායකත්වය), ඒ ප්‍රමාණයෙන් 90%ක්ම නිෂ්පාදකයින් විසින් වෙළෙඳපොළට රැගෙන ඒමත් ය.

මේ තුළ අතරමැදියාට රුපියල් 15ක් වැනි මිලකට අලෙවි කරන නිෂ්පාදනය රු.20ක් වැනි මිලකට අලෙවි කිරීමට නිෂ්පාදකයාට හැකිවෙයි. වෙළෙඳුන් රාශියක් සිටීම ද ඔහුට බොහෝ විට අලෙවි කිරීමට පහසුවක් වේ. මෙම තත්ත්වය දඹුල්ල වෙළෙඳපොළ තුළ දැකගත හැකිය. කෙසේ වුවද ඉල්ලුම් සැපයුම් තත්ත්වයන් මත මිල තීරණය වීම සිදුවන බැවින් බොහෝවිට නිෂ්පාදකයාට වාසි සහගත තත්ත්වයක් මෙන්ම ඇතැම් විට අවාසිසහගත තත්ත්වයන් ද ඇතිවිය හැකිය. ආරම්භ කිරීමේ මූලික අරමුණ මේතුළ ඉටු වී ඇති බව පැහැදිළිය. එනම් පැමිණෙන ප්‍රමාණයෙන් 61%ක්ම නිෂ්පාදකයින් වීමත් 32%ක් අතරමැදියන් වීමත් නිසා මෙම පැමිණෙන නිෂ්පාදකයින් විසින් සෘජුවම තොග වෙළෙඳුන් හමුවීම සිදු වේ.

වෙළෙඳපොළෙහි ක්‍රියාකාරිත්වය අනුව වෙළෙඳුන් ද විශාල සංඛ්‍යාවක් පැමිණීම තුළ නිෂ්පාදනයෙහි තත්ත්වය මත මිල වෙනස්වීම සිදුවන බැවින් තත්ත්වයෙන් ඉහළ නිෂ්පාදන සැපයෙන ගොවීන් වෙත හොඳ මිලකුත් අනෙක් පිරිසට සාපේක්ෂව අඩු මිලකුත් ලැබෙනු දැකිය හැකි විය.

නිෂ්පාදකයින්ට තම නිෂ්පාදන සඳහා ඉහළ මිලක් නොලැබීයාමට මූලික හේතුව ලෙස ඔවුන් සපයන නිෂ්පාදන ඉහළ ගුණාත්මයෙන් නොතිබීම හේතු වී ඇති අතර නිෂ්පාදන සඳහා නිසි ඇසුරුම් ක්‍රමයක් භාවිතා නොකිරීම එසේ නිෂ්පාදන ගුණාත්මක තත්ත්වයෙන් බාල වීමට හේතු වී ඇත. මේ නිසා නිෂ්පාදනවල පසු අස්වනු නාස්තිය 25%ක පමණ ඉහළ මට්ටමක දැකිය හැකිය.

මෙම වෙළඳපොළ තුළ අතරමැදිකරණය අවම වී ඇත. එනම්, එහි අතරමැදි කොටස නිෂ්පාදකයන් විසින් ලබා ගනී. ප්‍රදේශයේ නිෂ්පාදකයින් විශාල ප්‍රමාණයක් වෙළෙඳපොළ වෙත තම නිෂ්පාදන රැගෙන ඒම හරහා ඔවුන්ගේ ලාභ ආන්තිකය ඉහළ ගොස් ඇත. උදා:- නිෂ්පාදන ප්‍රදේශයේ අතරමැදියන් විසින් රු.20 ට එකතු කරන නිෂ්පාදන මෙම මධ්‍යස්ථානයේ දී රු.25ට අලෙවි වන්නේ නම් නිෂ්පාදන ගොවියා විසින්ම මධ්‍යස්ථානයට රැගෙන ඒම තුළ රු.24ක් ඔහුට ලැබේ. කොමිස් මුදල ලෙස රුපියලක් වැය වේ. මෙම කාර්යයේදී කණ්ඩායම් වශයෙන් භාණ්ඩ රැගෙන එන නිසා ප්‍රවාහන ගාස්තු ලෙස වැය වන්නේ කිලෝවක් සඳහා රු.1ක් තරම් සුළු මුදලකි.

පිටකොටුව තොග වෙළෙඳපොළ තුළ තීරණය වන මිලට සාපේක්ෂව 10%-15% ක් පමණ පහළ මිලක් මෙම මධ්‍යස්ථානයේ නිෂ්පාදන සඳහා තීරණය වන බව දැකිය හැකි විය. එනම් පිටකොටුව තොග වෙළෙඳපොළ තුළ රු.25ට අලෙවිකරණ නිෂ්පාදනයක් මේ තුළ රු.20-22 මිලකට අලෙවි වීම සිදු වේ.

මේ තුළ දැකිය හැකි තත්ත්වය නම් පිටකොටුව තීරණය වූ මිලගණන් වලට සාපේක්ෂව ඉහළ මිලක් දඹුල්ල මධ්‍යස්ථානය තුළ නිෂ්පාදකයන් ලබන බවයි. එනම්, දඹුල්ලේ තොග මිල යනු නිෂ්පාදකයාට ලැබෙන මිලට රුපියලක් වැඩි මිලයි. තවද, පිටකොටුව තොග මිලෙන් මැනිං වෙළෙඳපොළට ගෙවිය යුතු කොමිස් මුදලත් ප්‍රවාහන පිරිවැයත් අඩුකල පසු නිෂ්පාදකයාට ලැබෙන්නේ සාපේක්ෂව පහළ මිලකි.

* දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සම්බන්ධ වන විවිධ වූ කණ්ඩායම්වල පවත්නා ගැටලු සහ අඩුපාඩු ලෙස ඔවුන් පහත කරුණු දක්වා තිබුණි. මේ තුළ යටිතල පහසුකම් ප්‍රධාන ගැටලු ලෙස පෙන්වා තිබුණි.

1. ජල පහසුකම්
2. වැසිකිළි පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ අපිරිසිදුතාවය
3. නිසි කානු පද්ධතියක් නොමැති වීම සහ පවතින කානු නිසි පරිදි නඩත්තු නොවීම
4. අපද්‍රව්‍ය බැහැර කිරීමට නිශ්චිත ස්ථානයක් නොමැතිකම
5. වැසි ආවරණ නොමැති හෙයින් වැසි සහිත කාලවල දී වෙළෙදාම් කිරීමේ අපහසුතාවය
6. ආපනශාලාව පිරිසිදු තත්ත්වයේ නොමැති වීම.

විශේෂයෙන්ම යටිතල පහසුකම්වල පවතින අඩුපාඩු සෑම පාර්ශවයක්ම පෙන්වා දෙනු ලැබීය. මේ සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ගයන් තුළින් ඔවුන්ගේ අඩුපාඩු අවම කර ගැනීමට හැකිවනු ඇත.

1. ජලය ලබාදීමේ දී ක්‍රමවත් වැඩපිළිවෙලක් සැකසීම, පොදුවේ සෑම කඩ පේළියකටම ජල කරාම තුන බැගින් සවි කළ යුතුය. එසේම, සෑම කඩ හිමියෙකුටම ජලය ලබා දීමට කටයුතු කිරීම සහ ඒ සඳහා අදාළ බිල ඔවුන්වෙත පැවරීම. මේසඳහා දඹුලු ඔය, කණ්ඩලම වැනි ජල මූලාශ්‍රයන් මඟින් ජලය ලබා ගැනීමට කටයුතු කළ හැක.

2. මෙම මධ්‍යස්ථානය ආරම්භක අවස්ථාවේදී වැසිකිළි ඇතිකර තිබුණ ද නිසි නඩත්තුවක් නොමැතිකම නිසා ඒවා ඉතාමත්ම අපවිත්‍ර තත්ත්වයට පත්ව ඇත. දැනට මධ්‍යස්ථානයෙහි කළමණාකාරිත්වය විසින් වැසිකිළි පද්ධතියක් ඇති කිරීමට පියවර ගෙන ඇත. මෙම වැසිකිළි පහසුකම් ලබාදීමේදී කුමන හෝ පාර්ශවයකට ටෙන්ඩර් පටිපාටියක් මඟින් එහි නඩත්තුව පවරාදීම සහ පාවිච්චි කරන පුද්ගලයන්ගෙන් කිසියම් මුදලක් අය කර ගැනීමට කටයුතු කිරීම.

3. නිසි කානු පද්ධතියක් සැකසීමේ අවශ්‍යතාව සහ අපද්‍රව්‍ය බැහැර කිරීමේ නිශ්චිත ස්ථානයක් ලබාදීම ද කළ යුතු වීම. සෑම වෙළඳසැලක් ඉදිරිපිටම පවතින අපද්‍රව්‍ය කානු පද්ධතියට දැමීම වැළැක්වීම සහ නඩත්තු කටයුතු සොයා බැලිය යුතු වීම.

4. මෙම ප්‍රදේශය වියළි කාලගුණික තත්ත්වයෙන් යුතු ප්‍රදේශයක් වුව ද වැසි සහිත කෙටි කාලයේදී වෙළෙදාම් කිරීමට ඉතා අපහසු වීම. මේ සඳහා නිෂ්පාදන තබාගැනීමට නිසි ආවරණ සහිත ස්ථාන වෙළෙඳපොළ තුළ ඇති කිරීම.

5. ආපනශාලා හිමියන්ට එම ස්ථානයන්හි පිරිසිදුභාවය පිළිබඳ කටයුතු කිරීමට සැලැස්වීම සහ අපිරිසිදු තත්ත්වයෙන් යුතු ආහාර ලබා දෙන්නන්ට එරෙහිව නීතිමය තත්ත්වයන් යටතේ කටයුතු කිරීම.

6. ආර්ථික මධ්‍යස්ථානය තුළ පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොමැති බව සෑම පාර්ශවයක්ම දන්වන ලැබුව ද පවතින ඉඩකඩ තුළ නිසි පරිදි වාහන නැසිරීමේ ක්‍රමයන් ක්‍රියාත්මක වන්නේ නම් එය ප්‍රමාණවත් වේ. මේ සඳහා මධ්‍යස්ථානය තුළ නිකරුනේ රඳවා පවතින වාහන වෙනත් තැනකට යොමු කිරීමට කටයුතු කිරීම සහ වාහන නැසිරවීමට කළමනාකාරීත්වය මඟින් කටයුතු කිරීමට සැලැස්වීම.

7. මෙම මධ්‍යස්ථාන තුළ ද සමස්ථයක් ලෙස මිල තීරණය වීම, ඉල්ලුම් සැපයුම් තත්ත්වයන් අනුව සිදු වේ. නිෂ්පාදකයෝ තම නිෂ්පාදන ද්‍රව්‍ය කුමන මිලකට අලෙවි කළ ද තමන්ට ප්‍රමාණවත් නොවන බව පවසති. නමුත් නිෂ්පාදන නිසි ඇසුරුම් ක්‍රමයක් යටතේ සැපයීම සිදු නොවේ. එමනිසා, ඔවුන්ට ඇසුරුම් මාධ්‍ය භාවිතයේදී ප්‍රමිතියෙන් යුතු ඇසුරුම් ලබා දීමට කටයුතු කිරීම සහ ඒ සම්බන්ධයෙන් සෑම පාර්ශවයක්ම දැනුවත් කිරීම සිදුකළ යුතුය. මේ තුළින් නිෂ්පාදකයින්ට ඉහළ මිලක් ලබා ගත හැකිවන අතර පසු අස්වනු නාස්තිය ද අවම කර ගත හැකි වනු ඇත. මෙය සමස්ථය තුළින් 20%, 25% අපතේ යන නිෂ්පාදන රැකගැනීමට සිදුකළ යුතුම ක්‍රියාවකි. මේ සම්බන්ධයෙන් කළමනාකාරීත්වය සහ අනුරාධපුර පසු අස්වනු තාක්ෂණික ආයතනය සමග කටයුතු කිරීමට සැලැස්වීම සහ ක්‍රියාත්මක කිරීම.

8. මධ්‍යස්ථානය තුළ අවට ගොවි සංවිධාන 24ක සහභාගිත්වයෙන් ක්‍රියාත්මක වන රංගිරි දඹුලු ගොවි සමාගම වසර කිහිපයක සිට අක්‍රිය තත්ත්වයේ පවතී. මෙය සක්‍රීය කිරීමට කටයුතු කිරීම සහ ඒ සමග ගොවීන් දැනුවත් කිරීම තුළින් ඔවුන්ගේ ඵලදායිතාව ඉහළ දැමීමට කටයුතු සැලැස්වීම. ආර්ථික මධ්‍යස්ථානයේ සිටින කෘෂිකර්ම උපදේශක සහ ගොවි සමාගම් නිලධාරීන් හරහා එම වැඩසටහන් ක්‍රියාත්මක කළ හැකි වීම සහ මෙය ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකාරීත්වය හරහා සිදු විය යුතු වීම.

## කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය

බදුල්ල දිස්ත්‍රික්කයේ වැලිමඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ නුවරඑළිය ප්‍රදේශයට කි.මීටර් 20ක පමණ දුරින් කැප්පෙටිපොළ නගරයේ මෙම මධ්‍යස්ථානය පිහිටා තිබේ. 2001 අගෝස්තු මස 20 දින ආරම්භ කළ මෙම මධ්‍යස්ථානයේ අපේක්ෂිත අරමුණු පහත පරිදි වේ.

1. එළවළු සහ පලතුරු සඳහා සාධාරණ මිලක් ලබා ගැනීමට කටයුතු සැලැස්වීම
2. ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ එළවළු සහ පලතුරු පාරිභෝගිකයන්ට සහනදායී මිලකට ලබා ගැනීමට කටයුතු සැලැස්වීම.
3. ඇසුරුම්වල දී සහ ප්‍රවාහනයේ දී සිදුවන නාස්තිය අවම කිරීම.
4. අගනුවරට පමණක් සීමා වූ එළවළු තොග වෙළෙඳාම ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත කිරීම.
5. සෘජු සහ වක්‍ර රැකියා අවස්ථා රාශියක් බිහි කිරීම.
6. ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සෘජුවම දායක වීම
7. සැළසුම් සහගත ක්‍රමානුකූල වූ තොග වෙළඳාමක් තුළින් එහි නියුතු තොග වෙළෙඳුන්ගේ ආදායම ඉහළ නැංවීම.

ආහාර සහ අලෙවි සංවර්ධන අමාත්‍යාංශය මඟින් ආරම්භ කරන ලද මෙම ආර්ථික මධ්‍යස්ථානය පිහිටා ඇති ස්ථානය දඹුල්ල මධ්‍යස්ථානය මෙන් විශාල ඉල්ලුම් ප්‍රදේශයක් ආවරණය නොවන ස්ථානයකි. එසේ වුවද නිෂ්පාදන ප්‍රදේශයක් වීම හොඳ තත්ත්වයකි. කෙසේ වෙතත්, මේ තුළ කිසියම් ඌණ උපයෝජන තත්ත්වයක් ඇති බව පැහැදිලි විය.

දේශීය කෘෂි නිෂ්පාදන සඳහා නිසි වෙළෙඳපොළක් සැකසීමේ මූලික අරමුණ තුළ හිඳ අතරමැදිකරණයකින් තොරව නිෂ්පාදකයා සහ වෙළෙන්දා අතර හමුවීම තුළින් ගනුදෙනු සිදුවීම අපේක්ෂා කළ ද මෙම මධ්‍යස්ථානය තුළින් එය සිදු නොවේ.

ඉහත දැක් වූ අන්දමේ සුවිශේෂී වූ අරමුණු රාශියක් සඵල කරගැනීමේ අභිලාෂයෙන් වෙළෙඳසැල් 56කින් සමන්විත වන ලෙස මෙම මධ්‍යස්ථානය ආරම්භ විය. වර්තමානය වන විට, වෙළෙඳසැල් 26ක් පමණ විවෘතව පවතී. මෙම ඌණ උපයෝජන තත්ත්වය සඳහා විවිධ වූ හේතු බලපා තිබේ. මේ ආකාරයට අක්කර 2.4ක භූමි භාගයක් තුළ රුපියල් මිලියන 80ක ආයෝජන ප්‍රතිඵලයක් ලෙස ආරම්භ වූ මෙම මධ්‍යස්ථානයේ වර්තමානය වන විට ආදායමට වඩා වියදම ඉහළ ගොස් තිබේ. 2004 ජුනි මාසය වන විට ලැබිය යුතු හිඟ කඩ කුලී ප්‍රමාණය රුපියල් ලක්ෂ 35 ඉක්මවා තිබේ. රුපියල් 3,000/- ක් වන මාසික කඩ කුලිය 2004 ජනවාරි මස වන තෙක් වෙළෙඳසැල් කිහිපයකින් ලබාදීම සිදු කල ද මුදල් නොගෙවන වෙළෙඳසැල් වෙනුවෙන් නිසි ක්‍රියාමාර්ගයක් නොගැනීම හේතුවෙන් මුදල් ගෙවන පිරිස ද එය ගෙවීම නතර කර තිබේ. මහජන බැංකුව වෙත ලබා දී ඇති කඩ කාමරය වෙනුවෙන් පමණක් මුදල් ලැබීම සිදුවේ. තවද, මධ්‍යස්ථානයේ පවතින වියදම් මාසිකව ඉහළ යමින් පවතී. ආයතනය සතුව පවතින අරමුදල් භාරය තුළින් වියදම් ප්‍රතිපූර්ණය කර ගැනීම මේ වන විට සිදු වේ. මෙම මධ්‍යස්ථානයෙන් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම කෙරෙහි මධ්‍යස්ථානය පිහිටුවා ඇති ස්ථානය ද බලපා ඇත. එසේම මෙම ආර්ථික මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා තෝරාගත් ස්ථානය ඒ සඳහා උචිතම ස්ථානය නොවීම, මෙය හුදෙකලා ස්ථානයකි. විවිධ දිශාවන්ගෙන් වෙළෙඳුන් හා පැමිණෙන්නන්ට පහසුවෙන් ළඟාවිය හැකි ස්ථානයක් නොවේ. එමනිසා, අපේක්ෂිත පරිදි ආර්ථික මධ්‍යස්ථානයට නිෂ්පාදන ද්‍රව්‍ය රැගෙන ඒම හෝ මිල දී ගන්නන් පැමිණීම සිදු නොවේ.

මෙම මධ්‍යස්ථානය තුළ ගැටලු සහගත තත්ත්වයන් වර්තමානය වන විට ඇතිවීමට බලපා ඇති මූලික හේතු කිහිපයක් දැක්විය හැකිය.

1. ආර්ථික මධ්‍යස්ථානය ආරම්භක අවස්ථාවේ දී, වෙළෙඳසැල් ලබා දීමේ නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම. එනම් දේශපාලන හේතු මත වෙළෙඳසැල් ලබා දී තිබීම නිසා සුදුසු පුද්ගලයන්ට කඩ ලබා නොදීම.

2. ආර්ථික මධ්‍යස්ථානය තුළ ශක්තිමත් පරිපාලන ව්‍යුහයක් නොමැති වීම එනම්,
   i. පවතින නීති රාමුව තුළ වෙළෙඳසැල් පාලනය කිරීමේ නිසි බලය පාලන අධිකාරිය සතු නොවීම.
   ii. කළමනාකාරණ භාරය ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශය තුළ ලියාපදිංචි නොවී පැවතීම නිසා නීතිමය වශයෙන් කටයුතු කිරීමේ අවහිරතාව

3. ශක්තිමත් වෙළෙඳ සංගමයක් නොපැවතීම.
   i. පවතින වෙළෙඳ සංගමය දේශපාලනීකරණය වී තිබීම.

4. ආර්ථික මධ්‍යස්ථාන සංකල්පය තුළ කොමිස් ක්‍රමයට වෙළෙඳ කටයුතු කිරීම අත්‍යාවශ්‍ය කරුණක් වුවද, මේ තුළ එය ක්‍රියාත්මක නොවීම.

5. වෙළෙඳසැල් හිමියන් කිහිපදෙනෙකු හරහා සිදුවන වෙළෙඳසැල් ඒකාධිකාරී තත්ත්වය.

6. ආර්ථික මධ්‍යස්ථානයට නිෂ්පාදන සැපයීමේදී පවතින ගොවි සංවිධාන ශක්තිමත් නොවීම.

7. ආර්ථික මධ්‍යස්ථානය ආරම්භක අවස්ථාවේදී වෙළෙඳසැල් හිමියන් වෙත ලබාදුන් කොන්දේසි ඉටු නොවීම. එම කොන්දේසි වන්නේ,
   i. මධ්‍යස්ථානයේ සිට ගුවන් සැතපුම් 5ක් තුළ පවතින තොග රැස්කිරීමේ මධ්‍යස්ථාන ඉවත්කිරීම සහ එම වෙළෙඳුන්ට මෙම ස්ථානයේ වෙළෙඳසැල් ලබා දීම
   ii. ප්‍රදේශයේ යටිතල පහසුකම් සම්පූර්ණ කිරීම

ඉහත සඳහන් කළ ප්‍රධාන හේතූන් සහ තවත් විවිධ කරුණු මත කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයෙහි ක්‍රියාකාරිත්වය නිසි පරිදි ඉටුනොවන බව නිරීක්ෂණය විය. මෙම ආර්ථික මධ්‍යස්ථානයේ නිසි ක්‍රියාකාරිත්වයක් සඳහා පහත සඳහන් කරුණු ඉටුවිය යුතු බව පෙන්වා දිය හැකිය.

1. පාලන අධිකාරිය ශක්තිමත් කිරීම. එනම්, පවතින වෙළෙඳභාරය ලියාපදිංචි කළ යුතුයි. එවිට, හිඟ කඩ කුලී අයකර ගැනීමේ නීතිමය බලය ඔවුන් සතු වේ.
2. ආර්ථික මධ්‍යස්ථාන වෙත කොමිස් ක්‍රමය හඳුන්වා දිය යුතු වීම. මේ තුළින් අතරමැදිකරණයකින් තොරව ගොවීන් සහ වෙළෙඳුන් හමුවීම තුළින් මිල අවිනිශ්චිතතාව අවම වීම.
3. වෙළෙඳ සංගමය ශක්තිමත් කිරීම. මේ සඳහා පවතින වෙළෙඳ සංගමය අහෝසි කොට වෙළෙඳභාරය යටතේ ශක්තිමත් වෙළෙඳ සංගමයක් ඇති කිරීම.
4. ප්‍රදේශයේ ගොවි සංවිධාන ශක්තිමත් කිරීම.
5. ආර්ථික මධ්‍යස්ථානය ආරම්භක අවධිය තුළ වෙළෙඳසැල් හිමියන් වෙත ලබාදුන් පොරොන්දුවක් වන ආර්ථික මධ්‍යස්ථානයේ සිට ගුවන් සැතපුම් 5ක අවට ප්‍රදේශයේ එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉවත් කිරීම. මේ සඳහා ඔවුන්ට මෙම මධ්‍යස්ථානය තුළ පවතින ආරම්භයේ සිට විවෘත නොකළ වෙළෙඳසැල් නැවත ටෙන්ඩර් පටිපාටියක් තුළින් ලබා දීමට කටයුතු කිරීම.
6. ආර්ථික මධ්‍යස්ථානය අවට ප්‍රදේශයේ අත්‍යවශ්‍ය යටිතල පහසුකම් ලබාදිය යුතු වීම. මේ තුළින් වැඩි නිෂ්පාදන ප්‍රමාණයක් මධ්‍යස්ථානය වෙත ළඟා කර ගත හැකිවීම.

එසේම ආර්ථික මධ්‍යස්ථානය තුළ සිටින වෙළෙඳසැල් හිමියන් සහ ප්‍රදේශයේ ගොවීන්ගේ ආකල්පමය වෙනසක් ඇති විය යුතු වීම. මේ සඳහා රජය මැදිහත්වීම තුළින් ආර්ථික මධ්‍යස්ථානය තුළ ඉහත ක්‍රියාමාර්ග ක්‍රියාත්මක විය යුතුයි. මෙම කරුණු ඉටුවීම තුළ ශක්තිමත් ගොවි සංවිධානවල සහ ශක්තිමත් වෙළෙඳ සංගමයක ක්‍රියාකාරිත්වය මගින් පවතින දැඩි ඒකාධිකාරී තත්ත්වය අහෝසි කළ හැකි වේ. තරගකාරී වෙළෙඳපොළ තත්ත්වයක් තුළ කේවල් කිරීමේ ශක්තියක් නිෂ්පාදකයින්ට සහ වෙළෙඳුන්ට ලැබෙනු ඇත. කෙසේ වුව ද මෙම ආර්ථික මධ්‍යස්ථානය ඉදිකළ යුතුව තිබුණේ බණ්ඩාරවෙල ප්‍රදේශයේ බව සෑම පාර්ශවයක්ම විසින්ම පෙන්වා දෙනු ලබයි. දැන් එය කැප්පෙටිපොළ නගරයේ ආරම්භ කර තිබේ. මේ වනවිට, ආර්ථික මධ්‍යස්ථානය ආරම්භ කර තිබේ. නිසා මෙම මධ්‍යස්ථානයේ පවතින ආයතනික සහ පරිපාලනමය ගැටලු සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන අපේක්ෂිත තත්ත්වයන් කරා ළඟා වීමට කටයුතු කළ යුතුය. එනම් පවතින ඌණ උපයෝජනය පූර්ණ තත්ත්වයකට ගෙන ආ යුතුය.

මෙම ආර්ථික මධ්‍යස්ථාන තුළ සිදුකල සමීක්ෂණය තුළින් පහත තත්ත්වයන් අවබෝධ කර ගත හැක.

වගු අංක 02: ආර්ථික මධ්‍යස්ථාන වෙත නිෂ්පාදන පැමිණීම හා පිටවීමේ දෛනික ගණන් ගැනීම් කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය (2004.06.11 සිට 2004.06.17)

| දිස්ත්‍රික්කය | පැමිණීම කි.ග්‍රෑ | % | පිටවීම කි.ග්‍රෑ. | % |
|---|---|---|---|---|
| ගම්පහ | 300 | .0 | 37,600 | 6.2 |
| කොළඹ | 0 | 0.00 | 50,000 | 8.3 |
| මොණරාගල | 2,000 | 0.3 | 6,000 | 1.0 |
| කළුතර | 0 | 0 | 10,200 | 1.7 |
| මාතලේ | 0 | 0 | 172,300 | 28.6 |
| බදුල්ල | 593,412 | 96.9 | 86,370 | 14.3 |
| මාතර | 0 | 0 | 9,000 | 1.5 |
| නුවර | 0 | 0 | 21,300 | 3.5 |
| කෑගල්ල | 0 | 0 | 70,100 | 11.6 |
| කුරුණෑගල | 0 | 0 | 64,100 | 10.6 |
| හම්බන්තොට | 0 | 0 | 7,500 | 1.2 |
| අම්පාර | 0 | 0 | 13,500 | 2.2 |
| පුත්තලම | 0 | 0 | 4,040 | .7 |
| යාපනය | 0 | 0 | 1,500 | .2 |
| ගාල්ල | 0 | 0 | 28,500 | 4.7 |
| නුවරඑළිය | 12,085 | 2.0 | 13,350 | 2.2 |
| පොළොන්නරුව | 0 | 0 | 1,500 | .2 |
| එකතුව | 607,797 | 100.00 | 596,860 | 100.00 |

*මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණය, හෙ.ගො.ප.පු. ආයතනය - 2004*

## කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ නිෂ්පාදකයින් සඳහා අපේක්ෂිත ප්‍රතිලාභ විශ්ලේෂණය කිරීම සහ අරමුණු ඉටුවීම

මෙම මධ්‍යස්ථාන තුළ නිෂ්පාදකයින්ට ලැබෙන ප්‍රතිලාභ ඉතාම අවම මට්ටමක පවතී. මන්ද, මෙම මධ්‍යස්ථානය හරහා නිෂ්පාදකයින් සහ තොග වෙළඳුන් හමුවීම සිදු නොවීමයි. වෙළඳුන්ගේ පැමිණීම ඉතා පහළ මට්ටමක පවතී. කොමිස් ක්‍රමය ක්‍රියාත්මක නොවීමේ තත්ත්වය මත මධ්‍යස්ථානයේ සිටින වෙළෙඳසැල් හිමියන් විසින් අධික ලාභ ආන්තිකයක් ලබා ගැනීමට පෙළඹී ඇත. එනම් නිෂ්පාදකයන්ගේ නිපැයුම් මධ්‍යස්ථානයේ සිට කඩහිමියන් විසින් තීරණය කරන මිලට ගැනීම (බොහෝ විට ණයට) සිදු කෙරේ. ඔවුන් විසින් මධ්‍යස්ථානය වෙත පැමිණෙන වෙළෙඳුන්ට අලෙවි කිරීම සිදු කරයි. මෙම හුවමාරුවේදී ඔවුන් විසින් රු.5ක පමණ ලාභ ආන්තිකයක් තබා ගැනේ. එමනිසා, නිෂ්පාදන ප්‍රතිලාභය වෙළෙඳසැල් හිමියන් වෙත යාමක් සිදු වේ. මෙම තත්ත්වය නිසා අපේක්ෂිත ප්‍රතිලාභ ඉටු නොවේ.

මධ්‍යස්ථානයට සැපයෙන නිෂ්පාදන වලින් 93%ක්ම සැපයෙන්නේ නිෂ්පාදකයින් විසිනි. සෙසු 7%ක් අතරමැදියන් විසින් සපයනු ලබයි. නිෂ්පාදකයින්ගේ මෙම නිෂ්පාදන 93% ම අලෙවි කෙරෙන්නේ මධ්‍යස්ථානයේ සිටින වෙළෙඳුන්ට වේ. එනම්, තවත් අතරමැදියෙකු වෙතය. මේ තුළ නිෂ්පාදකයින්ට නිෂ්පාදන රැගෙන යාමට එන තොග වෙළෙඳුන් හමුවීමට හැකියාවක් නොමැත. එමනිසා, මෙම ස්ථානය තුළ නිෂ්පාදකයින්ට වාසිදායක පරිසරයක් නොපවතී. මෙවැනි තත්ත්වයන් මධ්‍යස්ථාන තුළ ක්‍රියාත්මක වීම නිසා තම නිෂ්පාදන මධ්‍යස්ථානය වෙත රැගෙන ඒම සිදු නොකරන නිෂ්පාදකයින්

ඒවා ප්‍රදේශයේ එකතු කරන මධ්‍යස්ථාන හරහා වෙළෙඳුන්ට ලබා දේ. එහිදී ලැබෙන මිල පහළ වුවත් ඔහුගේ කාලය, ප්‍රවාහන පිරිවැය වැනි කරුණු සලකා බලන විට මධ්‍යස්ථානයට සාපේක්ෂව ඔහුට වඩාත් වාසිදායක තත්ත්වයක් පවතී. මෙම කරුණට අමතරව ආර්ථික මධ්‍යස්ථානයේදී අලෙවිකරණයට බඳුන් වන තම නිෂ්පාදන සඳහා අත්පිට මුදල් නොලැබීමත්, ඒ තුළුව වෙළෙඳුන් පැමිණීම පහත් මට්ටමක පැවතීමත් නිසා තරගකාරී වෙළඳ පරිසරයක් මෙහි නිර්මාණය වී නොමැත. එනිසා, නිෂ්පාදකයින්ගේ පැමිණීම පහළ මට්ටමක පවතී. මෙම මධ්‍යස්ථානය තුළ දඹුල්ලට සාපේක්ෂව පහළ මිලක් නියම වේ. මෙහි ප්‍රධාන සැපයුම් ප්‍රදේශය දඹුල්ල මධ්‍යස්ථානය වේ (මෙම මධ්‍යස්ථානයෙන් පිටවන නිෂ්පාදන වලින් 30%ක්ම දඹුල්ල මධ්‍යස්ථානය වෙත රැගෙන යයි). කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය මඟින් ද දඹුල්ල වැනි තරගකාරී වෙළෙඳපොළක් බිහි කිරීමට උත්සාහ කලත් එය දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය සඳහා නිෂ්පාදන එකතු කරන උප මධ්‍යස්ථානයක් බවට පත් වී ඇත.

කැප්පෙටිපොල ආර්ථික මධ්‍යස්ථානය පිහිටුවීමේ මූලික අරමුණු ඉහත දක්වා ඇති අතර ඒ තුළ සෘජු සහ වක්‍ර රැකියා බිහිවීම කිසියම් ආකාරයෙන් ඉටුව ඇතිබව දැකිය හැකිය. නමුත් ප්‍රදේශයේ සංවර්ධනය සඳහා සෘජුවම දායක වීම වැනි අරමුණු ඉටු වී නොමැත. මධ්‍යස්ථානය තුළ වෙළඳසැල්වලින් ලැබිය යුතු හිඟ කඩ කුළී ආදායම පමණක් රුපියල් ලක්ෂ 40 ක් පමණ වේ. අදාළ අරමුණු වෙනුවෙන් වැය කළ යුතු මුදල් නොලැබී ඇතිබව අනාවරණය විය.

## මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය

ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශය යටතේ ආරම්භ කරන ලද මෙම මධ්‍යස්ථානය කොළඹ දිස්ත්‍රික්කය තුළ පාදුක්ක ප්‍රදේශයට කි.මී.05 ක පමණ ආසන්නයේ මීගොඩ ප්‍රදේශයේ පිහිටා ඇත. මෙහි ආරම්භක අරමුණ ලෙස අපනයනාභිමුඛ එළවළු, පළතුරු සහ දේශීය සහල් සැකසීම සහ අලෙවිය ලෙස දක්වා ඇත. එසේ නම් අපනයනය සහ තොග හුවමාරුව සිදු කිරීමේ අරමුණ මේ තුළින් අපේක්ෂිතය. නමුත් මධ්‍යස්ථානය ආරම්භක අවස්ථාවේ පැවති ඉහළ ප්‍රසිද්ධිය හමුවේ ඉතා හොඳින් තොග වෙළෙඳාම සිදු වුවද, වර්තමානය වන විට මෙය සිල්ලර වෙළඳාම පවතින (සති පොලක් වැනි) තත්ත්වයකට පත්ව තිබේ. මෙම මධ්‍යස්ථානය ද අරම්භක අවස්ථාවන්ට සාපේක්ෂව වර්තමානය වන විට කිසියම් කඩා වැටීමක් පෙන්නුම් කරයි.

දඹුල්ල සහ කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථාන නිෂ්පාදන ප්‍රදේශවල ස්ථාපිත කළ අතර එම ප්‍රදේශවල විධිමත් පරිදි මෙම මධ්‍යස්ථාන ඇති කිරීමට ප්‍රථම තොග වෙළෙඳාම පැවති ස්ථාන විය. එසේ වුවද, මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය අලෙවි ප්‍රදේශයක පැවතීමෙන් මින් පෙර වෙළෙඳපොළක් නොතිබූ ස්ථානයකුත් වී තිබේ. ගොවීන්ගේ පැමිණීම 17%ක ප්‍රමාණයක් වන මෙම මධ්‍යස්ථානය අතරමැදියන්ගෙන් මුළුමනින්ම ග්‍රහණය වූ ස්ථානයක් ලෙස දැක්විය හැකිය. අතරමැදියන්ගේ දායකත්වය 83% කි. රුපියල් මිලියන 70කින් ආරම්භ වූ මෙම මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක තත්ත්වයේ වෙළෙඳසැල් 76ක් පවතින අතර එළවළු වෙළෙඳාම සෑම වෙළෙඳසැලකම සිල්ලර තත්ත්වයෙන් ක්‍රියාත්මක වේ. ආරම්භක අවස්ථාවට සාපේක්ෂව වර්තමානය වන විට, මෙම මධ්‍යස්ථානය මෙවන් තත්ත්වයකට පත් වීමට හේතු රාශියක් බලපා තිබේ.

1. ආර්ථික මධ්‍යස්ථානය ආරම්භකර ඇති ස්ථානය ඒ සඳහා වඩාත් යෝග්‍ය ස්ථානයක් නොවීම. විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදු වූයේ නම් මෙම ස්ථානයන් ආරම්භ නොවීම. විශේෂයෙන් කොළඹ නගරය ආශ්‍රිත සියළු තොග බෙදාහැරීම තව දුරටත් පිටකොටුව මැනිං වෙළෙඳපොළ හරහා සිදුවීම.

2. මැනිං වෙළෙඳපොළ වැනි විශාල වෙළෙඳපොළක සිට එතරම් දුරක් නොවන ස්ථානයක මෙය ආරම්භ කර තිබීම.

3. විවිධ ප්‍රදේශවලින් පැමිණෙන පාරිභෝගිකයින්ට මෙන්ම නිෂ්පාදකයින්ට ද පහසුවෙන් පැමිණිය හැකි සංඩිස්ථානයක් නොවීම හා ප්‍රවාහන පහසුකම් එතරම් ඉහළ මට්ටමක නොමැති වීම.

4. වෙළඳසැල් ලබා දීමේදී නිසි ක්‍රියා පටිපාටියක් අනුගමනය නොකිරීම. පවතින වෙළෙඳසැල් ලබා දී ඇත්තේ දඹුල්ල, කැප්පෙට්පොළ, වැලිමඩ, පිටකොටුව මැනිං වෙළෙඳපොළ යන ස්ථානවල වෙළෙඳසැල් හිමිකරුවන්ට වීම. පසුව ඔවුන් මෙම ස්ථානයේ වෙළෙඳසැල් මීගොඩ ප්‍රදේශයේ වෙළෙඳුන්ට දෛනිකව රු.800-1000 අතර මිලකට බදු දී තිබේ. එමනිසා, ඔවුන් ඉතා ඉහළ මිල ගණන්වලට සිල්ලර වෙළෙඳාම සිදු කරයි. මන්ද, ඉහල කඩ කුලී ගෙවීමට සිදුවන නිසාවෙනි. එමනිසා, සිල්ලර වෙළෙඳාම ද අවට පොළවල්වල (පාදුක්ක/හෝමාගම) මිල ගණන්වලට වඩා ඉහළ අගයන් ගැනීමට හේතු වී තිබේ. මේ නිසා ආරම්භයේ පැවති වෙළෙඳාම පහත බැස තිබේ.

5. අකාර්යක්ෂම පරිපාලන තත්ත්වයක් පැවතීම. ආරම්භක අරමුණු සහ තොග වෙළෙඳාම පවත්වා ගැනීමේ ඉලක්ක සපුරාගැනීමට නොහැකි වීම. පරිපාලනය දේශපාලනීකරණය වී තිබීම මත තිබෙන ගැටලු හඳුනා ගනු ලැබුව ද, ක්‍රියා මාර්ග ගැනීමට අපොහොසත් වීම (නිෂ්පාදන අලෙවියේදී වෙළෙඳසැල්වල තරාදි සම්බන්ධ සහ පවතින මාළු වෙළෙඳපොළ සම්බන්ධ ගැටලු පැවතීම).

6. නිෂ්පාදකයින් මෙම ස්ථානයට නොපැමිණීම. ආර්ථික මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ මූලික අරමුණක් වන නිෂ්පාදකයා සහ වෙළෙන්දා, අතරමැදිකරණයකින් තොරව හමුවිය යුතු වුව ද මෙහි මුළුමනින්ම අතරමැදියන් සහ වෙළෙඳුන්ගේ හමුවීමක් සිදු වේ. මෙම ස්ථානයට රැගෙන එන නිෂ්පාදන අතරමැදියන් 5-7 අතර ප්‍රමාණයක් හරහා වෙළෙඳුන් තුළින් පාරිභෝගිකයින්ට ගලා යාමක් සිදු වේ. මේනිසා, පාරිභෝගිකයින්ට ඉතා ඉහළ මිලකට නිෂ්පාදන ගැනීමට සිදු වීම.

7. අවට ප්‍රදේශයේ ආරක්ෂිත තත්ත්වය ප්‍රමාණවත් නොවීම. එනම් නගරයෙන් බැහැරව පැවතීම සහ මෙම ස්ථානයට පැමිණෙන මාර්ග ඉතා අබලන්ව පැවතීම. මේ නිසා රාත්‍රී කාලයේදී ප්‍රවාහන දුෂ්කරතා පවතී. (මෙය සිල්ලර වෙළඳාම හෝ පැවතීම පහළ යාමකට හේතු වී තිබේ.)

මෙම ආර්ථික මධ්‍යස්ථානයේ ආරම්භක අපේක්ෂා සපුරා ගැනීමට අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග රාශියකි. එනම්,

1. කාර්යක්ෂම කළමනාකරණයක් ඇති කළ යුතුය.
   මේ සඳහා ආරම්භක අරමුණු ඉටුකර ගැනීම සහ වෙළෙඳපොළ කළමනාකාරිත්වය පිළිබඳ මනා දැනුමක් ඇති දේශපාලනීකරණයෙන් බැහැර වූ කළමනාකාරිත්වයක් ඇති කළ යුතුවේ.

2. සිල්ලර වෙළෙඳාම ආර්ථික මධ්‍යස්ථාන තුළින් බැහැර කළ යුතුය.
   මෙම මධ්‍යස්ථාන ආරම්භ කිරීමේ අරමුණ තොග හුවමාරුව බැවින් ඒ සඳහා ක්‍රියා කළ යුතුයි. සිල්ලර වෙළෙඳාම අවශ්‍ය නම් එය මෙම මධ්‍යස්ථානයෙන් බාහිර ස්ථානයක හෝ මධ්‍යස්ථානයේ කොටසක ඇති කළ යුතුය. දැනටමත් මේ තුළ සිදුවන වෙළඳාම් කටයුතු වලින් 60%ක් පමණ සිල්ලර වෙළෙඳාම වන නිසාවෙනි.

3. මෙම ස්ථානයෙහි වෙළෙඳසැල් ලබා දී ඇති දඹුල්ල, කැප්පෙට්පොළ, වැලිමඩ, පිටකොටුව, මැනිං වෙළෙඳපොළ යන ස්ථානවල හිමිකරුවන්ගේ සියළු වෙළෙඳසැල් දැනට ප්‍රදේශයේ

වෙළෙඳුන්ට රු.800-1,000 අතර දෛනික මිලකට කුලියකට දී තිබේ. මෙම තත්ත්වය නිසා නිෂ්පාදන ඉතා ඉහළ මිලකට අලෙවි වීම සිදු වේ. මෙම වෙළෙඳසැලේ දැනට වෙළඳාම් කරන පුද්ගලයින්ට ලබාදීම හෝ කුලිය අඩු කිරීමට පියවර ගත යුතුය.

4. අළුතින් නිමකර ඇති වෙළෙඳසැල් ටෙන්ඩර් පටිපාටියකින් කිසිදු දේශපාලන බලපෑමකින් තොරව ලබාදිය යුතුයි. එම වෙළඳසැල් විශේෂයෙන්ම මාළු හා පොල් වෙළෙඳසැල් සඳහා ලබාදිය යුතුය. එවිට දැනට පවත්නා ඒකාධිකාරය අවම වේ (පොල් සහ මාළු ඒකාධිකාරය).

5. අවට ප්‍රදේශයේ යටිතල පහසුකම් (ප්‍රවාහන දුෂ්කරතා, මාර්ග නඩත්තු කිරීම) මෙන්ම ආරක්ෂිත තත්ත්වයන් ඉහළ තත්ත්වයෙන් පැවතීමට කටයුතු කළ යුතුයි.

6. ආපනශාලාවන් ඇති කළ යුතුයි.

7. එමෙන්ම, දෛනික මිල ගණන් දැන ගැනීමට ඇති (දඹුල්ල, පිටකොටුව, මීගොඩ) පරිඝනක පුවරු නැවත ක්‍රියාත්මක තත්ත්වයට පත් කළ යුතුය. දෛනිකව ක්‍රියාත්මක වන මිල දැන ගැනීමට මිල දර්ශනයක් ඇති කළ යුතු වේ.

8. ආර්ථික මධ්‍යස්ථානය තුළට නිෂ්පාදන ප්‍රදේශ වලින් ප්‍රමාණවත් තරම් නිෂ්පාදන ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ.

වගු අංක 03 මගින් මෙම මධ්‍යස්ථානයට දින 07 ක් පුරා පැමිණි සහ පිට වූ නිෂ්පාදන ප්‍රමාණයන් සහ ප්‍රදේශයන් හඳුනාගත හැකිය. අනෙකුත් ආර්ථික මධ්‍යස්ථාන වලින් වෙනස්ව කොළඹ දිස්ත්‍රික්කය සඳහා 74% ක් පමණ වාහන පිටවීම සහ ඉතිරි ප්‍රමාණය කළුතර සහ ගම්පහ ඇතුළු ප්‍රදේශවලට පිටවීම සිදු වී ඇති බව දැනගත හැකිය. නිෂ්පාදන රැගෙන ඒම 33%ක්ම නුවරඑළිය ප්‍රදේශයෙන් වේ. මධ්‍යස්ථානයට සැපයෙන නිෂ්පාදනවලින් 83%ක්ම සැපයෙන්නේ අතරමැදියන් විසිනි. 17%ක් වැනි සුළු ප්‍රමාණයක් පමණක් නිෂ්පාදකයින් විසින් සැපයීම සිදුකරයි. එමනිසා, මෙම ස්ථානය නිෂ්පාදක අරමුණු ඉටුවන ස්ථානයක් නොවේ. නිෂ්පාදන සැපයීම තුළ උපරිම දායකත්වය නුවරඑළිය දිස්ත්‍රික්කය තුළින් අතරමැදියන් හරහා සිදු වේ.

වගු අංක 03: ආර්ථික මධ්‍යස්ථාන වෙත නිෂ්පාදන පැමිණීම හා පිටවීමේ දෛනික ගණන් ගැනීම් මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය (2004.06.28 සිට 2004.07.04)

| දිස්ත්‍රික්කය | පැමිණීම කි.ග්‍රෑ | % | පිටවීම කි.ග්‍රෑ. | % |
|---|---|---|---|---|
| පොළොන්නරුව | 5,500 | 0.8 | 1,000 | .2 |
| අනුරාධපුරය | 4,000 | 0.6 | 0 | 0 |
| රත්නපුර | 72,300 | 11.1 | 23,180 | 3.7 |
| ගාල්ල | 2,500 | 0.4 | 11,371 | 1.8 |
| මාතර | 1,000 | 0.2 | 1 | 0.09 |
| අම්පාර | 1,500 | 0.2 | 0 | 0 |
| වව්නියාව | 0 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය | 3,500 | 0.5 | 0 | 0 |
| මඩකලපුව | 0 | 0 | 0 | 0 |
| පුත්තලම | 64,000 | 9.8 | 5,040 | 0.8 |
| කුරුණෑගල | 8,000 | 1.2 | 10,000 | 1.6 |
| මාතලේ | 69,800 | 10.7 | 868 | 0.1 |
| කෑගල්ල | 16,400 | 2.5 | 6,600 | 1.1 |
| කොළඹ | 53,050 | 8.1 | 463,453 | 74.1 |
| කළුතර | 20,000 | 3.3 | 78,620 | 12.6 |
| නුවරඑළිය | 215,700 | 33.0 | 7 | 0 |
| නුවර | 4,500 | 0.9 | 920 | 0.1 |
| මොණරාගල | 27,500 | 4.2 | 0 | 0 |
| බදුල්ල | 25,000 | 3.8 | 0 | 0 |
| ගම්පහ | 29,550 | 4.5 | 15,217 | 2.4 |
| හම්බන්තොට | 26,600 | 4.2 | 9,150 | 1.5 |
| එකතුව | 650,400 | 100.00 | 625,426 | 100.00 |

*මූලාශ්‍රය: ක්ෂේත්‍ර සමීක්ෂණ - හෙ.කො.ගො.ප.පු. ආයතනය - 2004*

**ආර්ථික මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේදී සළකා බැලිය යුතු කරුණු**

1. ආර්ථික මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට ප්‍රථමයෙන්ම විධිමත් ශක්‍යතා අධ්‍යයනයක් සිදුකළ යුතුය. තොග වෙළෙඳපොළක අවශ්‍යතාවක් ඇති ප්‍රදේශයක් තෝරාගෙන මෙම අධ්‍යයනය සිදු කළ යුතුය. එනම්, ප්‍රදේශයේ ප්‍රමාණවත් තරම් නිෂ්පාදන පවතී ද යන්න සැළකිය යුතුය.

2. නිෂ්පාදකයින්, දැනට නිෂ්පාදන රැගෙන යාමට පැමිණෙන වෙළෙඳුන්, ප්‍රදේශයේ තොග වෙළෙන්දන් සහ ගොවි සංවිධාන සාමාජිකයින් මෙන්ම අදාළ ප්‍රාදේශීය රාජ්‍ය ආයතන නිලධාරීන්ගේ ද සහභාගිත්වයෙන් යුතුව මෙම පූර්ව අධ්‍යයන කටයුතු සිදු විය යුතුය. ඒ තුළින් අපේක්ෂිත පිරිවැය- ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු කළ යුතුය. මෙය කිසිදු බලපෑමකින් තොරව සිදු කළ යුතු අත්‍යාවශ්‍ය කරුණකි.

3. ප්‍රදේශයේ නිෂ්පාදන තොග සැපයුමට සාපේක්ෂව ඉදිකරනු ලබන මධ්‍යස්ථානයන්හි වෙළෙඳසැල් ප්‍රමාණය සීමා විය යුතුය.ශක්‍යතා අධ්‍යයනය තුළින් අවශ්‍ය වෙළෙඳසැල් ප්‍රමාණය තීරණය කරගත යුතුය.

## වෙළෙඳසැල් ලබාදීමේදී සැලකිය යුතු කරුණු

* වෙළෙඳසැල් ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් පටිපාටියක් ක්‍රියාත්මක කිරීම කළයුතු අතර දේශපාලන හිතවත්කම් මත පදනම්ව වෙළෙඳසැල් ලබා නොදිය යුතුය. එවැනි හිතවත්කම් මත වෙළෙඳසැල් ලබාදීමේදී එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේ අපහසුව (මාසික කුලිය ගෙවීම පැහැර හැරීම) සිදුවිය හැකිය. වෙළෙඳසැල් ලබා දීම ස්වාධීන මණ්ඩලයක් මගින් සිදුවිය යුතුය.

එසේම,

* ආර්ථික මධ්‍යස්ථානයේ පාලන අධිකාරිය වෙත වෙළෙඳසැල් පාලනය කිරීමේ සම්පූර්ණ බලය හිමිවන පරිදි නීතිමය තත්ත්වයක් ලබාදිය යුතුය.

ආර්ථික මධ්‍යස්ථානයේ කළමනාකරණ භාරයට වෙළෙඳ සංගමය පාලනය කළහැකි විය යුතුය. ප්‍රාදේශීය සභාව වෙළෙඳ සංගමය සමග එක්ව කටයුතු කළ යුතුය.

* වෙළෙඳාම සිදු වීමේදී තොග වෙළෙඳ මධ්‍යස්ථාන තුළ කොමිස් ක්‍රමය අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක විය යුතු වීම. කිලෝවක් රු.1 සිට රු.10 දක්වා ශත 50ක් ද, රු.10 හෝ ඊට වැඩි නම් රු.1 ක් ද අය කරගැනීම යෝග්‍ය වේ. මෙය ගොවියාගෙන් ලබා ගැනීම සිදු වේ.

* ආර්ථික මධ්‍යස්ථානය තුළ "නාඩි වෙළෙඳාම" නැවැත්විය යුතුය. එනම්, ගොවියා සහ වෙළෙන්දා හමුවීමෙන් නිෂ්පාදන හුවමාරු විය යුතුය. "නාඩි වෙළෙඳාම" යනු මධ්‍යස්ථානය තුළ සිටම නිෂ්පාදන අඩු මිලට ගෙන වැඩි මිලකට විකිණීමේ ක්‍රියාදාමයයි. මෙය සංවිධානාත්මක පිරිසක් විසින් සිදුකරනු ලබයි. (තවත් ඉහළ මුදලක් ලබන අතරමැදියෙකි).

* මධ්‍යස්ථානය තුළ රජයේ නියෝජිත වෙළෙඳපොළක් ක්‍රියාත්මක විය යුතුය (සතොස හෝ සමූපකාර වැනි).

* මිල දර්ශනයක් පැවතිය යුතුය. ඒ තුළ පෙරදින පැවති මිල, එම මධ්‍යස්ථානයේ මෙන්ම අනෙකුත් ප්‍රධාන තොග වෙළෙඳපොළවල්වල දෛනික මිල ද පුවරුවෙහි සඳහන් විය යුතුය.

* ශක්තිමත් පරිපාලන ව්‍යුහයක් පැවතිය යුතුය. වෙළෙඳසැල් වෙත පනවන නීතිරීති ක්‍රියාත්මක නොවන්නේ නම් ඒ සඳහා කටයුතු කළහැකි කළමනාකරණ භාරයක් පැවතිය යුතුය. ප්‍රාදේශීය සභාව, පළාත් සභාව හෝ නගර සභාව වෙළෙඳපොළ පාලනයට මැදිහත්ව අදාළ නීතිරීති සකස් කළ යුතුය.

- මේ තුළ එම ආයතනයන්හි නඩත්තුවට අවශ්‍ය මුදල් ලබාගැනීමට හැකියාවක් ඇත (පවිත්‍ර කටයුතු වෙනුවෙන් බදු ආදායම් ලබා ගැනීම)
- මෙම තතත්වය දේශපාලනීකරණයෙන් බැහැරව සිදුවිය යුතුය.

* ආර්ථික මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වයට මෙන්ම සාර්ථක රඳා පැවැත්මට මෙම මධ්‍යස්ථාන වලට විශේෂිත වූ නීති පද්ධතියක් පැවතිය යුතුය. උදා - දඹුල්ල. එමනිසා වෙළෙඳපොළක් පිහිටුවීමේදී මෙම කරුණ වෙත මූලිකත්වය දිය යුතුය. ඒ තුළ සාර්ථක වෙළෙඳපොළක් බිහි වේ.

* වෙළෙඳුන්ට අලෙවි කළමනාකරණය පිළිබඳ විධිමත් දැනුමක් ලබාදිය යුතුය. එමගින් අඩි සූරාකෑම වැළැක්වීම සහ කාර්යක්ෂම වෙළෙඳපොළ කළමනාකරණයක් ඇතිකළ හැකි වනු ඇත. එහි දී අලෙවි තොරතුරු ලබා දී ඔවුන්ගේ වෙළෙඳපොළ සවිඥාණය වැඩිකළ යුතුය.

* ආර්ථික මධ්‍යස්ථානය වෙත ප්‍රමාණවත් තරම් නිෂ්පාදන නොලැබෙන එළදාව අඩු කාලයේදී වෙළෙඳාම පහත යන තත්ත්වයක් පවතින්නේ නම් වෙනත් ව්‍යාපාරික කටයුතු සඳහා ඔවුන්ව යොමුකළ යුතුය. ඒ, වෙළෙඳුන් මධ්‍යස්ථානය තුළ රඳවා ගැනීමට කටයුතු කළ යුතු හෙයිනි.

මෙහි දී ප්‍රදේශවල අවශ්‍යතා හඳුනාගෙන සෑම වර්ගයේම නිෂ්පාදනයන් සඳහාම ආර්ථික මධ්‍යස්ථාන තුළින් අලෙවි කර ගැනීමට හැකි තත්ත්වයක් ඇතිකළ යුතුය.

* කෘෂි නිෂ්පාදනවලට අමතරව ප්‍රදේශයේ පවතින වෙනත් නිෂ්පාදන සඳහා අලෙවි සන්ධිස්ථානයක් ලෙස ද ආර්ථික මධ්‍යස්ථානය තුළ පහසුකම් ලබා දිය යුතුයි. උදා - මැටි භාණ්ඩ, වේවැල් භාණ්ඩ, විසිතුරු භාණ්ඩ, විසිතුරු නිෂ්පාදන ආදී කුඩා කර්මාන්ත නිෂ්පාදන සඳහා මෙකී පහසුකම් ලබාදිය හැකිය.

## අධ්‍යයනයේ සොයාගැනීම් නිගමන සහ යෝජනා

සමස්ථයක් වශයෙන් ගත්කළ මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයන්හි ක්‍රියාකාරිත්වය ඇගයීමත් එහි පවත්නා අඩුපාඩු සහ ගැටලු හඳුනා ගැනීමත්, එම හඳුනාගත් ගැටලු සඳහා යෝග්‍ය විසඳුම් නිර්දේශ කිරීමත් වේ. අනෙකුත් විශේෂ අරමුණු අතර විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුළින් අවට ප්‍රදේශවල නිෂ්පාදන සහ අලෙවිකරණ ව්‍යුහය කෙරෙහි සිදුකරන ලද බලපෑම පිළිබඳ අධ්‍යයනය කිරීමත් මේ අතර වේ. ඒ තුළ මෙම මධ්‍යස්ථානයන් පවතින ක්‍රියාත්මක ස්වරූපය තුළ පහත සඳහන් කරුණු දැක්විය හැකිය.

## අධ්‍යයනයේ සොයාගැනීම්

* දඹුල්ල, කැප්පෙටිපොළ සහ මීගොඩ යන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුන අතුරින් ස්වභාවික ලෙස වර්ධනය වෙමින් පැවති වෙළෙඳ මධ්‍යස්ථානයන් වශයෙන් දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය හඳුනාගත හැකිය. කැප්පෙටිපොළ සහ මීගොඩ යන ආර්ථික මධ්‍යස්ථාන අළුතෙන් ගොඩනගන ලද මධ්‍යස්ථාන වශයෙන් දැකිය හැකිය. මේ අනුව ස්වභාවිකවම ගොඩනැගුණු වෙළෙඳපොළක් වශයෙන් දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය අනෙකුත් මධ්‍යස්ථාන දෙකට සාපේක්ෂව සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතී.

* සමස්ථයක් වශයෙන් ගත්කළ අධ්‍යයනයට භාජනය වූ ආර්ථික මධ්‍යස්ථාන තුනෙහිම අලෙවිකරණයට සම්බන්ධ පාර්ශවකරුවන්, එනම් සැපයුම් අංශයේ පාර්ශවකරුවන්, ඉල්ලුම් අංශයේ පාර්ශවකරුවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් වන නිෂ්පාදන පැටවීම සඳහා සම්බන්ධ පාර්ශවකරුවන් අතර

අඩුවැඩි වශයෙන් සමානාත්මතාවයන් පැවතුන ද, එක් එක් ආර්ථික මධ්‍යස්ථාන තුළ ඔවුන් විසින් සිදුකරනු ලබන කාර්යයන්හි වැදගත්කම අනුව වෙනස්කම් දැකිය හැකි විය.

උදා: ආර්ථික මධ්‍යස්ථාන තුනෙහිම සැපයුම් අංශයේ පාර්ශවකරුවන් වශයෙන් වෙළෙඳසැල් හිමියන්, ගොවීන් හා අතරමැදියන් (නිෂ්පාදන එකතුකරන්නන්) සැළකිය හැකිය. එම විවිධ පාර්ශවයන් සිදුකරනු ලබන කාර්යයන්, එහි වැදගත්කම අනුව මධ්‍යස්ථානයෙන් මධ්‍යස්ථානයට වෙනස් වේ. දඹුල්ල හා කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුළ නිෂ්පාදන සැපයුම්කරුවන් ලෙස ගොවීන්ගේ දායකත්වය ප්‍රධාන වන අතර ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශ තුළ එම මධ්‍යස්ථාන පිහිටා තිබීම ඒ සඳහා හේතු වී තිබේ. නමුත් නිෂ්පාදන ප්‍රදේශ වලින් බාහිරව පිහිටා ඇති මීගොඩ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයේ සැපයීම් අංශය තුළ ගොවීන්ගේ සහභාගීත්වය ඉතාමත් සීමිත මට්ටමක පවතින අතර එහි ප්‍රධාන වන්නේ නිෂ්පාදන සපයන අතරමැදියන් ය.

* පොළ වෙළෙඳුන්, තොග වෙළෙඳුන් සහ සිල්ලර වෙළෙඳුන් සියලුම ආර්ථික මධ්‍යස්ථාන තුළ ඉල්ලුම් පාර්ශවය වශයෙන් විවිධ මට්ටමින් සහභාගී වන අතර කැප්පෙටිපොළ හා මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන තුළ පාරිභෝගිකයන්ට ද නිෂ්පාදන මිල දී ගැනීමට අවස්ථාව සළසාදීම තුළින් එම ආර්ථික මධ්‍යස්ථානයන්හි පාරිභෝගිකයන් ද ඉල්ලුම් පාර්ශවය තුළ ක්‍රියාත්මක වීමත් දැකිය හැකිය. කෙසේ වුවත්, කොමිස් ක්‍රමය ක්‍රියාත්මක වන දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය තුළ පාරිභෝගිකයින්ට නිෂ්පාදන මිල දී ගැනීමේ හැකියාවක් නොපවතී. දඹුල්ල හා කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුළ ඉල්ලුම සම්බන්ධයෙන් පොළ වෙළෙඳුන්ගේ සහභාගිත්වය ඉහළ මට්ටමක පවතින අතර මේ තත්ත්වය විශේෂයෙන්ම දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ දැකිය හැකි විය. ගොවීන් මුණ ගැසීම තුළින් මිල කේවල් කිරීමට ඇති හැකියාව මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වේ.

* භාණ්ඩ බෑමේ සහ පැටවීමේ පාර්ශවකරුවන්ගේ සහභාගීත්වය අධ්‍යයනයට ලක් වූ සියලුම ආර්ථික මධ්‍යස්ථානවල සමාන තත්ත්වයක් දැකිය හැකිය. කෙසේ වෙතත්, අනෙකුත් අලෙවිකරණ කාර්යයන් වන වර්ග කිරීම, ඇසුරුම් කිරීම, ප්‍රවාහනය, සැකසීම, මිල කිරීම හා වෙළෙඳපොළ අලෙවිකරණ කටයතු සම්බන්ධයෙන් සළකා බැලූ ආර්ථික මධ්‍යස්ථානයන් තුළ විවිධ සමානකම් මෙන්ම අසමානකම්ද දැකිය හැකිය. වර්ග කිරීම කිසිදු ආර්ථික මධ්‍යස්ථානයකින් සිදු නොකරන අතර එළවළු ඉක්මනින් විනාශ වීම හෙතුවෙන් දිගු කාලීනව තබා ගැනීමක් හෝ සිදු නොකරයි. තැලෙන සුළු තත්ත්වයක පවතින තක්කාලි වැනි නිෂ්පාදන සඳහා විශේෂිත ඇසුරුම් ක්‍රම වන ප්ලාස්ටික් පෙට්ටි යොදා ගනු ලැබුවද, අනෙකුත් එළවළු වර්ග සඳහා ගෝනි උර සියලුම ආර්ථික මධ්‍යස්ථානයන්හි භාවිතා කරනු ලබයි. කෙසේ වුවත්, මෙම ඇසුරුම් ක්‍රම භාවිතය තුළින් පසු අස්වනු නාස්තිය ඉහළ මට්ටමක පවතින බව පෙනීයයි.

* දඹුල්ල සහ කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථාන තුළ නිෂ්පාදන ප්‍රවාහනය සඳහා බහුලව භාවිතා කරනු ලබන මාධ්‍යයන් වශයෙන් ගොවීන් කණ්ඩායම් ලෙස එකතු වී කුළියට ගන්නා ලද ලොරි (කැන්ටර් රථ) ට්‍රැක්ටර් මෙන්ම ඔවුන්ගේම වාහන සහ යතුරුපැදි, පා පැදි, ත්‍රී වීලර් සහ පොදු ප්‍රවාහන සේවා ද දැකිය හැකිය. මෙහිදී මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය සළකා බැලූවිට එහි ප්‍රධාන ප්‍රවාහන මාධ්‍ය වශයෙන් ලොරි භාවිතා වන බව දැකිය හැකිවිය.

* දේශීය එළවළු සහ පලතුරු වර්ග ගබඩා කිරීම සඳහා පහසුකම් නොමැති අතර ඒවා ඉක්මනින් අනෙකුත් ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීම සිදු කරනු ලබයි. නමුත් අල, ලූනු කරවල වැනි ආහාර ද්‍රව්‍ය ආර්ථික මධ්‍යස්ථාන තුළ ඇති වෙළඳ කුටි තුළම යම් ප්‍රමාණයකට ගබඩා කිරීමක් සිදු කරනු ලබයි.

* මිල කිරීම සම්බන්ධයෙන් ගත් විට, සළකා බැලූ ආර්ථික මධ්‍යස්ථාන තුළ එය දෙආකාරයකට සිදුවන බව පෙනී යයි. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ කොමිස් ක්‍රමය ක්‍රියාත්මක වන අතර නිෂ්පාදන රැගෙන එන ගොවියාට හෝ අතරමැදියාට මිල සම්බන්ධයෙන් කේවල් කිරීමේ හැකියාවක් මේ තුළින් ලැබේ. ඒ නිසාම අනෙකුත් ආර්ථික මධ්‍යස්ථානවල ගොවීන් හා අතරමැදියන්ට සාපේක්ෂව දඹුල්ල මධ්‍යස්ථානයේ ඒ අයට ඉහළ මිලක් ලබාගැනීමේ හැකියාව පවතී. කැප්පෙටිපොළ හා මීගොඩ ආර්ථික මධ්‍යස්ථාන තුළ කොමිස් ක්‍රමය ක්‍රියාත්මක නොවන අතර නිෂ්පාදන මිල දී ගනු ලබන වෙළෙඳසැල් හිමියන් මිල තීරණය කරනු ලබයි. මෙහි දී ගොවියාට හෝ අතරමැදියාට කේවල් කිරීමේ හැකියාවක් නොමැති බැවින් දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයට සාපේක්ෂව අඩු මිලක් ලැබේ.

* වෙළෙඳ සංගම් සාමාජිකයින්, රජයේ නිලධාරීන්, ප්‍රාදේශීය සභාවේ සභාපති අදාළ ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් සහ ග්‍රාමීය කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගෙන් සැදුම්ලත් කළමනාකරණ භාරයක් විසින් සියලුම විශේෂිත ආර්ථික මධ්‍යස්ථානවල කටයුතු පාලනය කෙරේ. කළමනාකරණ භාරය විසින් එදිනෙදා අවශ්‍ය තීරණ ගැනීම සඳහා ආර්ථික මධ්‍යස්ථාන භාරව කළමනාකරුවෙකු පත්කරනු ලබයි. අනෙකුත් ආර්ථික මධ්‍යස්ථානයන්ට සාපේක්ෂව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ මෙම කළමනාකරණ පද්ධතිය ඉතා සාර්ථකව ක්‍රියාත්මක වන අතර එම ආර්ථික මධ්‍යස්ථානයේ සියලුම වෙළෙඳ කුටි ටෙන්ඩර් කැඳවීමක් තුළින් සුදුසු වෙළෙඳුන් වෙත ලබාදීම සිදුව තිබේ. කැප්පෙටිපොළ සහ මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයන්හි මේ කළමනාකරණ ක්‍රියාවලිය නිසිලෙස ක්‍රියාත්මක නොවන අතර වෙළෙඳ කුටි ලබාදීම ටෙන්ඩර් ක්‍රමයකට සිදු නොවීම තුළින් නුසුදුසු පුද්ගලයින්ට ද, වෙළෙඳ කුටි ලබා ගැනීමට අවස්ථාව සැළසී තිබේ. මීගොඩ සහ කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානයන්හි පවතින අකාර්යක්ෂමතාවයන්ට මෙය ප්‍රධාන සාධකයක්ව තිබේ.

* ප්‍රදේශයේ පිහිටීම අනුව ඉතාමත්ම සාර්ථක ස්ථානයක ආරම්භ කර ඇති දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය අනුරාධපුරය, මඩකලපුව, ත්‍රිකුණාමලය, නුවර, කුරුණෑගල ආදී ප්‍රධාන දිස්ත්‍රික්ක සම්බන්ධකරණ ප්‍රධාන මංසන්ධියක පිහිටා තිබේ. විශාල වශයෙන් එළවළු නිෂ්පාදනය සිදු කෙරෙන නිෂ්පාදන ප්‍රදේශයක පිහිටා තිබීම ද මෙහි සාර්ථකත්වය සඳහා හේතු වී ඇත. මේ අනුව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ සාර්ථක ක්‍රියාකාරීත්වයට එහි පිහිටීමේ යෝග්‍යතාව ප්‍රධාන වශයෙන් බලපා ඇති අතර කැප්පෙටිපොළ සහ මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය දඹුල්ලට සාපේක්ෂව යෝග්‍ය ස්ථානයන්හි පිහිටා ඇති බවක් නොපෙනේ. මේ මධ්‍යස්ථාන දෙක ඉදිකිරීමේදී සමාජ ආර්ථික සහ තාක්ෂණිකමය බලපෑම්වලට වඩා දේශපාලනික බලපෑම් ඉස්මතු වී ඇති බවක් පෙනේ. කෙසේ වුව ද කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය නිෂ්පාදන ප්‍රදේශයක පිහිටා තිබුන ද, මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ නිෂ්පාදන ප්‍රදේශයක නොවීම කැපී පෙනෙන කරුණකි. කෙසේ වුවත්, ඉහත ආර්ථික මධ්‍යස්ථාන දෙකේ පවත්නා ව්‍යුහමය ගැටලු සඳහා ඉහත කරුණු බලපා ඇති බව පෙනේ.

* දිනයක් තුළ කෘෂි නිෂ්පාදන හුවමාරුවීමේ ප්‍රමාණය දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළ ඉතා ඉහළ මට්ටමක පවතී (සාමාන්‍යයෙන් දිනකට කි.ග්‍රෑ.800,000 ප්‍රමාණයක් හුවමාරු වේ). මෙය කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය තුළ කි.ග්‍රෑ. 90,000 ක් පමණ වන අතර මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයේ එය අඩු මට්ටමක පවතී. මේ අනුව, දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය තුළින් ප්‍රදේශයේ නිෂ්පාදනයන් සඳහා යම් මට්ටමක සාර්ථක වෙළෙඳපොළක් බිහි කළ ද මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයෙන් ඉල්ලුමක් ජනිත වන්නේ පිට ප්‍රදේශවල නිෂ්පාදන සඳහා බව පෙනේ.

* දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය බිහි කිරීමෙන් පසුව ගොවීන්ට තම නිෂ්පාදන සඳහා අපේක්ෂිත ඉහළ මිලක් නොලැබුන ද, ආර්ථික මධ්‍යස්ථානය ඉදි කිරීමට පෙර ලැබූ මිලට සාපේක්ෂව ඉහළ මිලක් ලබා ගන්නා බව පෙනේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන තුළ පවතින කොමිස් ක්‍රමය තුළින් ගොවීන්ට තම නිෂ්පාදන මිල සම්බන්ධයෙන් කේවල් කිරීමට ඇති හැකියාව මෙයට හේතුවයි. කෙසේ වුවත්, නිෂ්පාදනවල පවතින අඩු ගුණාත්මක තත්ත්වයත් වෙළෙඳපොළ සැපයුම අඛණ්ඩව සිදු නොවීමත් යන කරුණු මිල ගණන් වෙනස්වීම කෙරෙහි බලපානු ලබයි.

* කැප්පෙටිපොළ හා මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයන්හි කොමිස් ක්‍රමය ක්‍රියාත්මක නොවන බැවින් තරගකාරී ස්වභාවයක් දක්නට නොලැබෙන අතර වෙළෙඳුන් විසින් මිල නියම කිරීම නිසා කේවල් කිරීමේ හැකියාව ගොවීන් වෙත නොලැබේ. විශේෂයෙන්ම කැප්පෙටිපොළ ආර්ථික මධ්‍යස්ථානය තුළ ගොවීන්ට තම නිෂ්පාදන සඳහා ලැබෙනුයේ ඉතාමත්ම අඩු මිලකි. තවද, මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය පාරිභෝගික ප්‍රදේශයක් තුළ පවතින බැවින් ගොවීන්ට යම් මට්ටමක සාර්ථක මිලක් ලබාගත හැකි වුවත් මෙහිදී ගොවීන්ගේ සහභාගීත්වය පවතින්නේ ඉතාමත්ම අඩු වශයෙනි.

* දඹුල්ල විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය විශාල ප්‍රදේශයක් තුළ නිෂ්පාදන ක්‍රියාවලිය හැසිරවීම සඳහා මෙන්ම එහි ගොවීන්ගේ ආදායම් මට්ටම් සහ අනෙකුත් පාර්ශවයන්ගේ ආදායම් මට්ටම් වර්ධනය කෙරෙහි ද සාර්ථක ලෙස බලපා ඇති බව පෙනේ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් සිදුවන බලපෑම තරම් නොවුවත් කැප්පෙටිපොළ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය ඉදිකිරීම් නිසා විශාල පරිමාණයෙන් නිෂ්පාදන මිල දී ගැනීම සඳහා සැළකිය යුතු වෙළඳුන් පිරිසක් පැමිණීම හේතුවෙන් යම්කිසි මට්ටමකින් නිෂ්පාදනවල මිල ඉහළයාම කෙරෙහි මෙන්ම රැකියාවන් වර්ධනය තුළින් ආදායම් තත්ත්වය ඉහළ යාම කෙරෙහිත් යම් දුරකට බලපෑමක් ඇති වී තිබේ. කෙසේ වුවද, මීගොඩ ආර්ථික මධ්‍යස්ථානය තුළින් නිෂ්පාදකයන්ට ලැබෙන ප්‍රතිලාභ පවතින්නේ ඉතාමත් අඩු මට්ටමකිනි.

* මේ අනුව, විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන බිහි කිරීම තුළින් බලාපොරොත්තු වූ සියලු අරමුණු නිසියාකාරව සාක්ෂාත් කරගැනීමට අපොහොසත් වී තිබුනත් එය නිසි ආකාරව ස්ථාපිත කිරීම තුළින් අපේක්ෂිත සියලු අරමුණු කරා නිසි පරිදි ළඟාවීමේ හැකියාව පවතින බව පෙනී යයි. මේ අනුව, මෙම අධ්‍යයනය තුළින් අවධාරණය කරනු ලබන්නේ විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකිරීමේදී දේශපාලනික මැදිහත්වීමකින් තොරව සමාජ, ආර්ථික හා තාක්ෂණික කරුණු පිළිබඳව සැළකිලිමත් වීම තුළින් එහි සාර්ථකත්වය කරා ළඟාවිය හැකි බවයි.

* ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් නොමැති වීම (උදා. පිරිසිදු වැසිකිළි, ජල පහසුකම්, වාහන නැවැත්වීමේ පහසුකම්) සහ කාර්යක්ෂම සහ නිර්මාණශීලී කළමනාකාරිත්වයක් නොමැතිවීම වැනි ගැටලු පවතින ආර්ථික මධ්‍යස්ථානවල අසාර්ථකත්වය සඳහා හේතු සාධක වී ඇත.

## ප්‍රතිපත්තිමය නිර්දේශ

(අ) ඉදිරියේදී ආර්ථික මධ්‍යස්ථානයක් ඉදි කිරීමේදී යම් ප්‍රදේශයක් තෝරා ගැනීමට පළමුව නිසි පරිදි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම

(ආ) ආර්ථික මධ්‍යස්ථාන තුළ වෙළෙඳ කුටි ලබා දීම නිසි පරිදි ටෙන්ඩර් කැඳවීමක් තුළින් සිදු කිරීම

(ඇ) ආර්ථික මධ්‍යස්ථාන කළමනාකරණ සහ පරිපාලන කටයුතු ප්‍රාදේශයේ පළාත් පාලන ආයතන හා ඒකාබද්ධව සිදු කිරීම.

දේශීය කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම සඳහා නිසි වෙළෙඳපොළක් අවශ්‍යම වූ කාල වකවානුවක ඉහත ප්‍රතිපත්තිමය නිර්දේශ තුළින් මධ්‍යස්ථානයේ ඉදිරි පැවැත්මට අවශ්‍ය මූලික පදනමක් වැටෙනු ඇත. එසේ සිදු නොවන්නේ නම් මධ්‍යස්ථාන තුළ ව්‍යුහාත්මක ගැටලු මෙන්ම අපේක්ෂාවන් ඉටු නොවන තත්ත්වයක් ඇතිවීම නොවැලැක්විය හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ


1. Mene Gay, M (1998) , Frame Work and Basic Approach for Food Marketing Project for Sri Lanka, HARTI Colombo
2. Mene Gay, M &Cayton, w (1998) Study of Agricultural Market in Sri Lanka Final Chart, HARTI, Colombo
3. Rupasena,L.P. Bandara, R.M.R. Ravichandran, T. (901) Study of Market Information System in Matale District.
4. වාර්ෂික වාර්තා, (2001-2003) විශේෂිත ආර්ථික මධ්‍යස්ථානය, කැප්පෙටිපොළ.